ජාතික ගමනාගමන කොමිෂන් සභාව (ජාගකොස)

වාර්ෂික වාර්තාව

2019

ලිපිනය

241, උද්‍යාන පාර,

කොළඹ 05.

වෙබ් අඩවිය

www.ntc.gov.lk

විද්‍යුත් තැපෑල

info@ntc.gov.lk

ක්ෂණික ඇමතුම්

1955

NTC/PL/ Annual Report / 2019 2020.05.15

ගරු ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍ය,
ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය,
7 වන මහල,
සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල.

වාර්ෂික වාර්තාව - 2019

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) වගන්තිය හා රාජ්‍ය ව්‍යාපාර යහපාලනය සඳහා වූ උපදෙස් මාලාවේ අංක 05 හා 06 පරිච්ඡේද අනුව සකස් කරන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව, වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාව ඉතාමත් සතුටින් ඉදිරිපත් කරමි.

ශශී වෙල්ගම
සභාපති,
ජාතික ගමනාගමන කොමිෂන් සභාව.

පටුන

පරිච්ඡේදය	පිටුව
කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය	01
සභාපතිතුමාගේ පණිවිඩය	03
දළ විශ්ලේෂණය	05
කොමිෂන් සභාවේ සංයුතිය	06
2019 වර්ෂයේ කාර්යසාධනය	07
වාර්ෂික ගිණුම්	33
විගණකාධිපති වාර්තාව	51

කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය

2019 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා

1.	ජනක මල්ලිමාරච්චි මහතා	-සභාපති
2.	නීතිඥ ප්‍රසාද් ඩබ්. සිරිමාන්න මහතා	-සාමාජික
3.	ඩබ්.ඩී. අයිවන් සනත් මහතා	-සාමාජික
4.	පී.ඒ. සරත් පෙරේරා මහතා	-සාමාජික
5.	ආනන්ද විජයරත්න මහතා	-සාමාජික (නිලබලයෙන්)
6.	ඒ.එම්.ආර්.ජේ.කේ. ජයසිංහ මහතා	-සාමාජික (නිලබලයෙන්)
7.	වරලත් ඉංජී. එස්.පී.ඩබ්.ජයසිරිවර්ධන මහතා	-සාමාජික
8.	ඒ.එම්. අසංග දයාරත්න මහතා	-සාමාජික (නිලබලයෙන්)

මාණ්ඩලික රැස්වීම් හා විගණන හා කළමනාකරණ රැස්වීම්

2019 වර්ෂය තුළ පවත්වනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව 11 කි.

2019 වර්ෂය තුළදී පවත්වනු ලැබූ විගණන හා කළමනාකරණ රැස්වීම් සංඛ්‍යාව 03 කි.

සභාපතිතුමාගේ පණිවුඩය



රටක සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමේ ක්‍රියාදාමය තුළ ප්‍රවාහනය වෙත පැවරී ඇත්තේ අද්විතීය කාර්යභාරයකි. කවර රටක වුවද ප්‍රවාහන ජාලයේ කාර්යක්ෂමතාවය, ආර්ථික සංවර්ධනය හා සමාජයීය අභිවෘද්ධිය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ පොදු බස් මගී ප්‍රවාහන පද්ධතිය විධිමත්, ගුණාත්මක හා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත කාර්යයන් සම්පාදනය කරමින් රටෙහි ප්‍රවාහන අවශ්‍යතා විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වගකීම වේ.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අනුව පිහිටුවන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ශ්‍රී ලාංකික ජන සමාජය වෙත ඉතාමත් කාර්යක්ෂම හා සුවපහසු ප්‍රවාහන සේවාවක් උරුම කරදීමේ උදාර අභිලාශයෙන් 2019 වර්ෂය තුළද විවිධ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත.

රාජ්‍ය භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක 'සමාජීය අවශ්‍යතාවයන් සපුරාලීම අරමුණු කොට ගත් ව්‍යාපෘති' වශයෙන් පාසල් සිසුන්ට මානසික හා කායික අපහසුතාවයන්ගෙන් තොරව කලට වේලාවට පාසලට යාමේ සහ ආරක්ෂාකාරීව ආපසු නිවෙස් බලා පැමිණීමේ පහසුකම් සැලසීම අරමුණු කරගෙන 'සිසු සැරිය' බස් රථ සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම, ප්‍රවාහන පහසුකම් නොමැති පෙදෙස් වල වෙසෙන ජනතාවට තම දෛනික අවශ්‍යතාවන් සඳහා විශ්වාසදායී ප්‍රවාහන සේවයක් සැලසීම අරමුණු කරගෙන 'ගැමි සැරිය' බස්රථ සේවාව පවත්වාගෙන යාම, රාත්‍රී කාලයේ සහ හිමිදිරි උදැසන බස් සේවාවල පවතින හිඟකම නිසා මගීන්ට මුහුණ පෑමට සිදුවන අපහසුතා මගහැරවීම සඳහා 'නිසි සැරිය' බස් සේවාව ක්‍රියාත්මක කිරීම ප්‍රධාන තැනක් ගනී.

මීට අමතරව පෞද්ගලික ප්‍රවාහන මාධ්‍යයන් භාවිතා කරන ජනතාව පොදු මගී ප්‍රවාහන සේවා වෙත ආකර්ෂණය කර ගැනීමටත් පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව වර්ධනය කිරීම පිණිසත් මගී ජනතාව වෙත විශ්වසනීය, ආරක්ෂාකාරී, සුවපහසු පොදු ප්‍රවාහන සේවාවක් ලබාදීම මගින් පොදු බස් මගී ප්‍රවාහන සේවයෙහි ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. තවද බස්රථ ධාවකයින්ගේ ව්‍යාපාරික අපේක්ෂා සාර්ථක කරගත හැකි වන පරිදින් සියලුම බස් ධාවකයින්ට සම අවස්ථා සැලසෙන පරිදි

විද්‍යාත්මක ඒකාබද්ධ චක්‍රීය කාලසටහන් සකස් කිරීමේ ව්‍යාපෘතිය ද අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත.

මීට අමතරව ප්‍රවාහන අධිකාරින්හි කළමනාකාරිත්වය, අන්තර් පළාත් බස්රථ හිමිකරුවන්, පාසල් රථ නියාමක කණ්ඩායම් ඇතුළු මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ විවිධ පාර්ශවකරුවන් ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා 2019 වර්ෂයේ නව ව්‍යාපෘතියක් ආරම්භ කර වැඩමුළු ගණනාවක් පවත්වනු ලැබ ඇත.

තවද පොදු ප්‍රවාහනය සඳහා ගෝලීය තත්ව පදනම් වූ (GPS) වාහන පිරික්සුම් ක්‍රමය තුළින් ක්ෂණිකව බස් රථ නියාමනය කිරීමටත් මගී පැමිණිලි විමර්ෂණය හා තොරතුරු සැපයීමටත් කටයුතු කර ඇත.

එමෙන්ම ප්‍රවාහනය සම්බන්ධ සැලසුම් සකස් කිරීමේදී සංඛ්‍යාලේඛන සඳහා හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. මේ නිසා ප්‍රවාහනය සම්බන්ධ සියලු දත්ත එක්තැන් කළ වාර්තාවක් වශයෙන් ප්‍රවාහන සංඛ්‍යා ලේඛන වාර්තාව වැදගත් වේ. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ප්‍රවාහනයට සම්බන්ධ රාජ්‍ය ආයතන ගණනාවකින් සංඛ්‍යා එක්රැස් කර පුළුල් විෂය පථයක් ආවරණය වන පරිදි ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව එළි දැක්වීමට ද වාර්ෂිකව සිදු කරනු ලබයි.

මෙම සියලුම ව්‍යාපෘති තුළින් පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව වර්ධනය කිරීම, ආරක්ෂිත හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සැපයීම අරමුණු කෙරේ. දිනෙන් දින උත්සන්න වන මාර්ග තදබදය අවම කිරීම අරමුණු කර පොදු මගී ප්‍රවාහන සේවාව වෙත මගී ආකර්ෂණය ඇතිකරනු වස් පොදු මගී සේවාවට අදාල යටිතල පහසුකම් සංවර්ධනය දීප ව්‍යාප්තව සිදු කරමින් පවතී.

වත්මන් රජයේ ප්‍රත්පත්තිය වන සෞභාග්‍ය දැක්ම අනුගමනය කරමින් පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය කාර්යක්ෂම හා ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා නවීන තාක්ෂණය වැඩිවැඩියෙන් උපයෝගී කර ගැනීමත් ඒතුලින් නව රජය පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉටුකර ගැනීමට අපේක්ෂා කරන සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අතිගරු ජනාධිපතිතුමාටත්, අතිගරු අගමැතිතුමාටත්, ගරු ප්‍රවාහන කළමණාකරන සේවා අමාත්‍යතුමාටත් ශක්තිය වීම සඳහා සහයවන ප්‍රවාහන කළමණාකරන සේවා අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්ටත් , ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ සමස්ථ කාර්යමණ්ඩලයටත් නන් අයුරින් සහයෝගය දක්වන සියළු පාර්ශවයන්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය ප්‍රකාශ කර සිටිමි.

ශශී වෙල්ගම
සභාපති,
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

දළ විශ්ලේෂණය

අපගේ දැක්ම...

දිවයින තුළ සමාජ-ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීම සඳහා ගුණාත්මක, පිරිවැය ඵලදායී සහ ආරක්ෂාකාරී ඒකාබද්ධ ප්‍රවාහන පද්ධතියක් හා සේවාවක් මගින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුගේම විවිධ ගමනාගමන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සහතිකවීම.

අපගේ මෙහෙවර...

මගී ප්‍රවාහනයට අදාල ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ශ්‍රී ලංකා රජයට උපදෙස් දීම සහ පොදුජන ප්‍රවාහන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කාර්යක්ෂම බස් ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතිකවීම සඳහා අවශ්‍ය නියාමන රාමුවක් සකස්කිරීම.

අපගේ අරමුණු / පරමාර්ථ

- බස් සේවා සංවර්ධන කාර්යයන් ගුණාත්මකව මෙන්ම ප්‍රමාණාත්මකව ඉතා උසස් මට්ටමකින් අඛණ්ඩව පවත්වාගෙන යාම.
- කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් වර්ධනය කිරීම.
- තමන්ට වඩාත් සුදුසු බස් සේවයක් තෝරාගැනීමට මගීන්ට අවස්ථාව සැලසෙන ප්‍රවාහන පද්ධතියක් වර්ධනය කිරීම.
- මගී ප්‍රවාහන සේවාවන්හි නියැලී මෙහෙයුම්කරුවන්ගේ ස්ථාවරත්වය හා පැවැත්ම පිළිබඳව සහතික වීම.
- ග්‍රාමීය හා සංවර්ධනය වෙමින් පවත්නා ප්‍රදේශවල ක්‍රියාත්මක වන අඩු ප්‍රතිලාභ ලබන එහෙත් සමාජ අවශ්‍යතාවයන් අනුව අත්‍යවශ්‍ය වන බස් සේවාවන් සඳහා මූල්‍ය ආධාර ලබාදීම.
- මගී ප්‍රවාහන බස් සේවාවන් මගින් ඇතිවන පරිසර හානිය වැළැක්වීම සඳහා ක්‍රමවේදයක් සැලසුම්කොට වර්ධනය කිරීම.
- බස්රථවල ධාවන කාලයන් විධිමත් කිරීමෙන් බස්රථවල ඵලදායිතාවය වැඩිකිරීම.
- බස්රථ ධාවන කටයුතුවල ආරක්ෂාකාරී බව සහ විනයගරුක බව තහවුරු කිරීම.
- අන්තර් පළාත් සහ පළාත්බද යන අංශ දෙකෙහිම බස් ප්‍රවාහන ක්‍රම සම්බන්ධීකරණය කිරීම.
- රටේ සමස්ත ශ්‍රම ඵලදායිතාවය වැඩිදියුණු කිරීම.

කොමිෂන් සභාවේ සංයුතිය

නිලබලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනෙකුගෙන්ද, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රවාහන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන තවත් සාමාජිකයින් පස් දෙනෙකුගෙන්ද කොමිෂන් සභාව සමන්විත වේ. කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් සහ සැලසුම්, ධාවන හා සේවා අධීක්ෂණ, තත්ත්ව ආරක්ෂණ සහ බාහිර සම්බන්ධතා, මුදල් හා ප්‍රසම්පාදන යන දෙපාර්තමේන්තු 04 හාරව ක්‍රියාකරනු ලබන අධ්‍යක්ෂකවරුන් හතරදෙනෙකුගෙන් සමන්විත වේ.

2019 වර්ෂය අවසාන වනවිට කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 219 ක් වූ අතර සේවයේ යෙදී සිටි ස්ථිර සේවක සංඛ්‍යාව 191 ක් විය.

2019.12.31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව

අනු අංකය	තනතුරු නාමය	සේවක කාණ්ඩය	අනුමත කාර්යමණ්ඩලය	දිනට සේවයේ යෙදී සිටි කාර්යමණ්ඩලය
01	අධ්‍යක්ෂ ජනරාල්	HM 2 -1	01	01
02	අධ්‍යක්ෂ	HM 1-1	04	03
03	සහකාර අධ්‍යක්ෂ	MM 1-1	17	13
04	කණිෂ්ඨ කළමනාකාර	JM 1-1	21	21
05	කළමනාකරණ සහකාර	MA 4	36	35
06	කළමනාකරණ සහකාර	MA 2-1	3	1
07	කළමනාකරණ සහකාර	MA 1-1	76	71
08	රියැදුරු	PL 3	13	15
09	කාර්යාල කාර්ය සහායක	PL 1	12	12
10	වේලා සටහන්කරු	PL 1	33	18
11	කම්කරු	PL 1	3	1
	එකතුව		**219**	**191**

මූලාශ්‍රය - පාලන දෙපාර්තමේන්තුව, ජාගකොස

2019 වර්ෂයේ කාර්යසාධනය

1. සමාජයීය ශුභසාධනය ප්‍රමුඛ කොටගත් බස් සේවා සැපයීම

ප්‍රවාහනය වෙත පැවරී ඇති අතිමහත් වූ කාර්යභාරයන් අතරින්, ප්‍රවාහනය සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත කාර්යයන් සම්පාදනය කරමින් රට තුළ මගී ප්‍රවාහන අවශ්‍යතා විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරය වේ.

ඒ අනුව ශ්‍රී ලාංකීය පොදු ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් අති විශාල මෙහෙවරක් ඉටුකිරීමේ පරම අභිලාෂයෙන් විවිධ මාදිලියේ ප්‍රවාහන සේවා ව්‍යාපෘති ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් දීප ව්‍යාප්තව ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි.

ඒ අතරින් පාසල් දරුවන් සඳහාම වෙන් වූ 'සිසු සැරිය' පාසල් බස් රථ සේවාවත්, ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා ඉටු කරදීම සඳහා 'ගැමිසැරිය' බස් සේවාවත්, රාත්‍රී බස් සේවාව විධිමත්ව පවත්වාගෙන යාමට 'නිසි සැරිය' රාත්‍රී බස් සේවාවත් යනුවෙන් ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාවට නංවා ඇත. මෙම සේවා, බස්රථ ධාවකයාහට මූල්‍යාධාර ලබාදීමේ පදනමින් ආරම්භ කර ඇති ව්‍යාපෘති වේ. මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයෙහි බස් රථ ධාවකයින්ගේ දායකත්වය ලබාගනු ලැබේ.

1.1 පාසල් බස්රථ සේවා ව්‍යාපෘතිය 'සිසු සැරිය'



'සිසුසැරිය' බස්රථ සේවාව

ශ්‍රී ලංකාවේ බොහෝ ජනප්‍රිය පාසල් නගර ආශ්‍රිතව ස්ථාපිත කර ඇති බැවින් වර්ෂයක් පාසා ග්‍රාමීය පාසල් වල සිට නාගරික ජනප්‍රිය පාසල් වෙත සංක්‍රමණය වන ශිෂ්‍ය ප්‍රජාව ශීඝ්‍රයෙන් වැඩිවන ප්‍රවණතාවක් දක්නට ලැබේ. ඒ සමගම මහා මාර්ගයට එකතුවන පාසල් වෑන්රථ ප්‍රමාණයද ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් උදෑසන හා දහවල් කාලයේ නගර ආශ්‍රිතව උත්ගත වන ප්‍රවාහන ගැටළු නිසා ඊට මැදිවන පාසල් දරුවන් මෙන්ම මහා මාර්ගය භාවිතා කරනු ලබන අනෙකුත් මහජනතාවද පත්වන්නේ ඉතා පීඩාකාරී තත්ත්වයකටය. මෙසේ මොටර් රථ හා ලොකු කුඩා වෑන්රථ විශාල ප්‍රමාණයක් ප්‍රධාන මාර්ගවලට එකතුවීම නිසා නගර ආශ්‍රිතව ඇතිවන මාර්ග තදබදයට පිළියමක් වශයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගනු

ලැබූ වැදගත් හා කාලෝචිත පියවරක් ලෙස පාසල් සිසුන් සඳහාම වෙන්වූ බස් රථ සේවාවක් වන'සිසු සැරිය' පාසල් බස්රථ ව්‍යාපෘතිය හැඳින්විය හැක.

තවද සිසුසැරිය පාසල් බස්රථ සේවා ව්‍යාපෘතිය තුළින් පාසල් සිසුන්ට අත්කර දී ඇති යහපත එම දරුවන්ගේ දෙමාපියන්ටද මහත් වූ අස්වැසිල්ලක් වන බව නොරහසකි. කලට වේලාවට පාසලට ගොස් අධ්‍යාපන කටයුතු වෙහෙසකින් තොරව සිදු කරගෙන ආරක්ෂාකාරීව ආපසු පැමිණිමේ පහසුකම් සැලසීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ළමා හිංසනය අවම කර, දෙමාපියන්ට ආර්ථික වශයෙන් සහනදායී ගාස්තු ක්‍රමයක් ලබාදීම මගින් විශ්වාසවන්ත සහ විධිමත් සමාජ මෙහෙවරක් ඉෂ්ට සිද්ධ කිරීම ව්‍යාපෘතියේ අනෙකුත් පරමාර්ථ වේ.

මෙහිදී 'සිසු සැරිය' ව්‍යාපෘතිය සඳහා අවම වශයෙන් ආසන 42ක් සහිත බස්රථ යෙදවීම අනිවාර්ය වන අතර සාමාන්‍ය බස් ගාස්තුවෙන් 50%ක් පමණක් සිසුන්ගෙන් අයකරනු ලබන අතර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ සහ පෞද්ගලික අංශයට අයත් බස්රථ මගින් බස් සේවා ලබාගනු ලැබේ. මෙහිදී ධාවකයාට අහිමි වන ආදායම වෙනුවෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් කලින් ගිවිසගත් ගාස්තු ක්‍රමයක් අනුව පසුව ප්‍රතිපූරණය කරමින් සේවාවන් පවත්වා ගෙන යනු ලැබේ. මේ සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවට මහා භාණ්ඩාගාරය මගින් මුදල් වෙන් කරනු ලැබේ. මේ වන විට 'සිසු සැරිය' ව්‍යාපෘතිය යටතේ යොදවා ඇති බස්රථ 1419 නිසා (ආසන 15 පමන වන) පාසල් වැන් රථ 6500කට අධික ප්‍රමාණයක් නගරය වෙත පැමිණීම වලක්වා ඇති අතර පාසල් දරුවන් 100,000කට අධික සංඛ්‍යාවක් සේවාව ලබාගනියි.

2019 වර්ෂය සඳහා නව 'සිසු සැරිය' සේවා 56ක් ආරම්භ කර ක්‍රියාත්මක කළ අතර 2019.12.31 දින වනවිට සමස්ථ සේවා සංඛ්‍යාව පහත වගුවෙහි දැක්වේ.

පළාත	'සිසු සැරිය' බස් සේවා සංඛ්‍යාව
බස්නාහිර	422
දකුණ	104
වයඹ	298
උතුරු මැද	163
සබරගමුව	122
ඌව	100
නැගෙනහිර	117
මධ්‍යම	51
උතුර	36
අන්තර් පළාත්	7
එකතුව	**1419**

මූලාශ්‍රය - සැලසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස

'සිසු සැරිය' සේවා නිසිලෙස පවත්වාගෙන යන්නේද යන්න නිරන්තර පරීක්ෂාවට ලක් කරනු ලබන අතර ගිවිසුම් කොන්දේසි කඩකිරීම්, නොදන්වා සේවයෙන් ඉවත් වීම ආදී හේතු නිසා බස්රථ සේවා 55ක් 2019 වර්ෂය තුළදී අවලංගු කර ඇත.

2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිසුසැරිය සේවා සැපයීම වෙනුවෙන් දරණ ලද වියදම රුපියල් මිලියන 564.716 ක් වන අතර 2019 වර්ෂය වෙනුවෙන් ගෙවීමට ඇති බිල්පත් වල වටිනාකම රුපියල් මිලියන 46.0කි.

1.2 ග්‍රාමීය බස්රථ සේවා ව්‍යාපෘතිය - 'ගැමි සැරිය'



ප්‍රවාහන පහසුකම් නොමැති, නගරයෙන් දුරස්ථ, ගම්බදව ජීවත් වන ජනතාව වෙත ප්‍රවාහන පහසුකම් ලබාදී, ගමත් නගරයත් යා කරමින් 2005 වර්ෂයේදී 'ගැමිසැරිය' ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. වර්තමානය වන විට ප්‍රවාහන පහසුකම් නොමැතිව එදිනෙදා රැකීරක්ෂා කටයුතු ඉටුකර ගැනීමට පවා නොහැකිවන පසුබිමක එහි අවශ්‍යතාව මැනවින් හඳුනාගත් ජාතික ගමනාගමන කොමිෂන් සභාව 'ගැමිසැරිය' ව්‍යාපෘතිය 2019 වර්ෂය තුළදී තවදුරටත් ව්‍යාප්ත කරමින් නව සේවා 11ක් ආරම්භ කරන ලදී. මෙම බස්රථ සේවාව වෙනත් පොදු මගී ප්‍රවාහන සේවා ක්‍රියාත්මක නොවන මාර්ග සඳහා පමණක් හඳුන්වා දෙනු ලබන අතර ආරම්භයේ සිට වසර 03ක් දක්වා ධාවකයාට සහනාධාර ගෙවනු ලැබේ. ආරම්භයේ සිට මේ දක්වා එසේ හඳුන්වා දෙන ලද නව 'ගැමිසැරිය' සේවා සංඛ්‍යාව 70කට අධික වේ. මේ වන විට සහනාධාරය ලබමින් පවතින සේවා සංඛ්‍යාව 15ක් වන අතර නව සේවා ආරම්භ කිරීම සඳහාද පියවර ගනිමින් පවතී. ව්‍යාපෘතිය සඳහා පෞද්ගලික අංශයේ ධාවකයන් පමණක් යොදා ගැනෙන අතර විවෘත ටෙන්ඩර් ක්‍රමයක් යටතේ ධාවකයින් තෝරා ගනු ලැබේ.

2019 වර්ෂය තුළ නව සේවා 11ක් ආරම්භ කර ක්‍රියාත්මක කර ඇති අතර 2019.12.31 දිනට සමස්ථ 'ගැමිසැරිය' සේවා සංඛ්‍යාව පහත වගුවෙහි දැක්වේ.

පළාත	'ගැමිසැරිය' බස් සේවා සංඛ්‍යාව
මධ්‍යම	01
නැගෙනහිර	10
වයඹ	04
එකතුව	**15**

මූලාශ්‍රය - සැලසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස

2019 වර්ෂය තුළදී සහනාධාර ලබමින් ක්‍රියාත්මක වන වසර තුන අවසන් වීම නිසා කොන්දේසි ප්‍රකාරව ඉවත් වූ සේවා සංඛ්‍යාව 02ක් වන අතර 2019.12.31 දිනට 'ගැමිසැරිය' සේවාව සැපයීම වෙනුවෙන් දරණ ලද වියදම රුපියල් මිලියන 2.665ක් වන අතර 2019 වර්ෂය වෙනුවෙන් ගෙවීමට ඇති බිල්පත් වල වටිනාකම රුපියල් මිලියන 2.3කි.

1.3 රාත්‍රී බස් සේවා ව්‍යාපෘතිය - "නිසි සැරිය"

රාත්‍රී කාලයේ සහ අළුයම් කාලයේ බස් සේවා අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල මහජනතාවට දුෂ්කරතා රැසකට මුහුණදීමට සිදුවී ඇත. එනම්, දිනපතා දුර බැහැර සිට රැකියා සහ අධ්‍යයන කටයුතු සඳහා කලට වේලාවට නගරයට ළඟාවීමට පහසුකම් නොමැති වීමත් සවස් කාලයේ නිසි වේලාවට ආපසු නිවෙස් කරා පැමිණීමට නොහැකි වීමත් ඉන් ප්‍රධාන වේ. මෙම ගැටළුව දිවයිනේ ප්‍රධාන මාර්ග හැරුණුවිට සෙසු මාර්ගවල බොහෝවිට දක්නට ලැබේ. මීට පිළියමක් වශයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව 2005 වර්ෂයේ 'නිසි සැරිය' බස් සේවා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මෙම 'නිසි සැරිය' බස්රථ සේවාව අළුයම හා රාත්‍රී ගමන්වාර පමණක් ධාවනය කිරීම නිසා ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන නමුත් ප්‍රවාහන සේවාව නොලැබීම නිසා මගී ජනතාව පත්වන දැඩි දුෂ්කරතා අවම කිරීම මූලික අරමුණ වේ.



'නිසි සැරිය' රාත්‍රී බස් සේවාව

'නිසි සැරිය' ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ රාත්‍රී 8.00න් පසු අවසන් ගමන් වාරය සහ පසුදින අළුයම ප්‍රථම ගමන් වාරය සඳහා පොදු බස් සේවා යොදවා මගීන්ගේ ගමනාගමන අවශ්‍යතාවය සපුරා දීමයි. ප්‍රවාහන දුෂ්කරතා සහිත ප්‍රදේශවල මගී ජනතාවට මෙම සේවාව ලැබීම මහත් අස්වැසිල්ලක් වන අතර වඩාත් විශ්වාසදායී සේවාවක් ලෙස ස්ථාපිත කිරීම සඳහාත් අධීක්ෂණ කටයුතු පහසු කර ගැනීම සඳහාත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ පමණක් යොදා ගැනේ. 2019 වර්ෂය තුළදී නව සේවා 06ක් පමණක් ආරම්භ කර ක්‍රියාත්මක කළ අතර 2019.12.31 වන විට ක්‍රියාත්මකව පැවති සමස්ථ 'නිසිසැරිය' සේවාවන් සංඛ්‍යාව පහත පරිදි වේ.

පළාත	'නිසි සැරිය' බස් සේවා සංඛ්‍යාව
බස්නාහිර	62
දකුණ	33
වයඹ	20
උතුරුමැද	11
මධ්‍යම	28
සබරගමුව	08
ඌව	09
නැගෙනහිර	03
උතුර	05
එකතුව	**179**

මූලාශ්‍රය - සැළසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස

දැනට දිවයිනේ බොහෝ පළාත්වල 'නිසි සැරිය' බස් සේවාව ක්‍රියාත්මකව ඇති, බොහෝ දෙනාගේ පැසසුමට ලක්වන ඉතා කාලෝචිත සමාජ සේවාවක් වී ඇත. ඉදිරි කාලයේදී මෙම සේවාව තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා මේ වන විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් එකඟතාවය පලකර ඇත. ලබාදෙන සේවාවේ ගුණාත්මය ආරක්ෂා කරගැනීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ජංගම පරීක්ෂණ නිලධාරීන් යොදවා වරින් වර එම බස්සේවා පරීක්ෂා කරවමින් උපරිම සේවයක් ලබා දීම සඳහා දැඩි කැපවීමෙන් ක්‍රියා කරනු ලබයි.

2019 වර්ෂය තුළදී 'නිසි සැරිය' බස් සේවාව වෙනුවෙන් දරණ ලද පිරිවැය රුපියල් මිලියන 14.367ක් වන අතර 2019 වර්ෂය වෙනුවෙන් ගෙවීමට ඇති බිල්පත් වල වටිනාකම රුපියල් මිලියන 9.9 කි.

2. බස්රථ සේවක පිරිස් ලියාපදිංචිය හා පුහුණු කිරීම

අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවය භාවිතා කරනු ලබන මගීන්ට වඩාත් කාර්යක්ෂම, ඵලදායී සහ තත්ත්වයෙන් උසස් සේවාවක් ලබා දීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා 2006 වර්ෂයේ සිට මේ දක්වා අඛණ්ඩව රියැදුරු කොන්දොස්තර පුහුණු වැඩසටහන් පවත්වාගෙන එනු ලබයි. මෙම පුහුණු වැඩසටහන් න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් හරහා ද සිදුකරනු ලබන අතර

ශ්‍රී ලංගම රියදුරු පාසල හරහා ප්‍රායෝගික පුහුණුවීම් සිදුකරනු ලබයි. එසේම මාර්ග ආරක්ෂාව, මහජන සම්බන්ධතා පැවැත්වීම, ධනාත්මක චින්තනය වැනි දේශන මාතෘකා පදනම් කරගෙන දිවයිනේ ප්‍රවීණ දේශකයන් යටතේ න්‍යායාත්මක දැනුම ලබාදෙනු ලබයි. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සෑම වර්ෂයකම පවත්වාගෙන යනු ලබන අතර, 2019 වර්ෂයේ පුහුණු කරන ලද රියදුරු කොන්දොස්තර මහතුන්ගේ විස්තර පහත පරිදි වේ.

2019 වර්ෂය තුලදී නව රියැදුරු මහත්වරුන් 984 ක් ද කොන්දොස්තර මහත්වරුන් 1222 ක්ද අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙහි පුහුණු වී හැඳුණුම්පත් ලබා ඇත.

මෙමඟින් නව රියැදුරු මහතුන් 1222 ක් නව කොන්දොස්තර මහතුන් 984 දෙනෙකු පුහුණු කර ඇති අතර, 123 දෙනෙකුහට නැවත පුහුණුව ලබාදී ඇත. තවද, රියැදුරු කොන්දොස්තර මහත්වරුන් 1935 දෙනෙකුට යාවත්කාලීන කිරීමේ පුහුණුව ලබාදී හැඳුනුම්පත් යාවත්කාලීන කර ඇත.

මාසය	2019 වර්ෂය තුල පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව					
	නව		යාවත්කාලීන		බලපත්‍ර කොන්දේසි කඩකිරීම් වෙනුවෙන් නැවත පුහුණු	
	රියැදුරු	කොන්දොස්තර	රියැදුරු	කොන්දොස්තර	රියැදුරු	කොන්දොස්තර
ජනවාරි	98	81	80	88	0	0
පෙබරවාරි	76	61	74	86	0	0
මාර්තු	117	90	75	109	0	01
අප්‍රේල්	46	47	41	54	0	0
මැයි	83	70	51	80	03	05
ජුනි	103	86	75	74	10	06
ජූලි	127	103	84	101	10	08
අගෝස්තු	97	74	88	88	06	10
සැප්තැම්බර්	118	91	85	91	06	09
ඔක්තෝම්බර්	137	110	94	108	09	10
නොවැම්බර්	116	80	66	72	04	05
දෙසැම්බර්	104	91	68	103	09	12
එකතුව	**1222**	**984**	**881**	**1054**	**57**	**66**

මූලාශ්‍රය - තත්ව ආරක්ෂණ දෙපාර්තමේන්තුව ජාගකොස

නව රියැදුරු/කොන්දොස්තර පුහුණු පාඨමාලා - 2019



යාවත්කාලීන රියැදුරු/කොන්දොස්තර පුහුණු පාඨමාලා - 2019



බලපත්‍ර කොන්දේසි කඩකිරීම් වෙනුවෙන් නැවත පුහුණු පාඨමාලාව - 2019



පුහුණු වැඩසටහන් පාඨමාලා -2019





2019 වර්ෂයේ රියැදුරු/ කොන්දොස්තර වරුන් 2820 දෙනෙකු පුහුණු වැඩසටහන් 44ක් පවත්වමින් පුහුණු කරවා ඇත.

2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය සඳහා වූ සමුච්චිත වියදම රු. මිලියන 5.492ක් විය.

3. දුරගමන් සේවා සංඥා පුවරු



ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මගී සේවා අවසර පත්‍ර යටතේ ධාවනය වන දුරසේවා බස්රථ සහ පළාත් ප්‍රවාහන අධිකාරී මගී සේවා අවසර පත්‍ර යටතේ ධාවනය වන දුර ගමන් සේවා

බස් රථ නියමිත වේලාවට තම ගමනාන්තයට ළඟා කරවීම තුලින් දුරසේවා බස්රථ වල ගුණාත්මක බව වර්ධනය කිරීමේ අරමුණින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් දුර ගමන් සේවා බස්රථ සඳහා සීමිත නැවතුම් ස්ථාන හඳුන්වා දීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මෙමගින් දුරසේවා බස්රථවලින් කෙටි දුර සේවා බස්රථ වල ආදායමට වන හානිය අවම කිරීමද මූලික අපේක්ෂාවකි.

2019.06.18 දිනැති අංක 2128/9 දරණ ගැසට් පත්‍රය මඟින් මෙම නව සංඥාව ප්‍රසිද්ධ කරන ලදී.

2019 වර්ෂය අවසාන වන විට කොළඹ සිට කතරගම දක්වා මෙම සංඥා පුවරු ස්ථාපිත කළ යුතු ස්ථාන හඳුනා ගෙන ඇති අතර, ඒ සඳහා පළාත් ප්‍රවාහන අධිකාරීවල සහ මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතියද හිමිව ඇත.

2019.12.31 දිනට ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 0.034 ක් වැය වී ඇත.

4. කාලසටහන් පිළියෙල කිරීම හා සංශෝධනය කිරීම

දිවයින පුරා අන්තර්පළාත් පොදු මගී ප්‍රවාහන බස්සේවා සපයන සියලුම බස් ධාවකයින්ට සම අවස්ථා සැලසෙන පරිදි ධාවන කාලසටහන් සකස් කිරීමත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බස් ධාවකයින් අතර පවතින අහිතකර තරඟකාරීත්වය අවම කිරීමත් එමගින් ධාවකයින්ගේ ව්‍යාපාරික ස්ථාවරත්වය ආරක්ෂා කිරීමත් මගී ජනතාව වෙත විශ්වසනීය, ආරක්ෂාකාරී මෙන්ම ඉහළ ගුණාත්මක භාවයකින් යුත් පොදු ප්‍රවාහන සේවාවක් ලබාදීමත් මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ. මෙයට අමතරව බස්රථයක් සාමාන්‍යයෙන් දිනකට ධාවනය වන කිලෝමීටර් ප්‍රමාණය උපරිම කිරීමද මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු අතර ප්‍රධාන වේ.

ශ්‍රී ලංගම හා පෞද්ගලික බස්රථ සඳහා ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම සඳහා 2019 වර්ෂය තුළදීද මහත් වෙහෙසක් දැරූ නමුදු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ප්‍රමාණවත් දායකත්වයක් නොලැබීම, ඒකාබද්ධ කාලසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පොදු පර්යන්ත පහසුකම් නොමැතිවීම මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය අඩු වීම සඳහා දැඩි ලෙස බලපා ඇත. එබැවින් ශ්‍රී ලංගමය ඒකාබද්ධ කාලසටහන් අනුව බස්රථ ධාවනයට එකඟ වන තුරු පෞද්ගලික බස්රථ සඳහා පමණක් වක්‍රීය කාලසටහන් සකස් කිරීම හා සංශෝධනය කිරීම ජාතික ගමනාගමන කොමිෂන් විසින් සිදු කරනු ලැබේ.

2019.12.31 දිනට මේ වෙනුවෙන් දරන ලද පිරිවැය රුපියල් මිලියන 0.273 කි.

5. බස් ගාස්තු විෂමතා ඉවත් කිරීම

2002 වර්ෂයේ අනුමත කර ඇති ගාස්තු ප්‍රතිපත්තිය අනුව වර්තමානයේ දී පොදු මගී ප්‍රවාහන බස් රථවල ගාස්තු නිර්ණය කිරීම සිදු කරනු ලැබේ. මෙම ගාස්තු ප්‍රතිපත්තිය අනුව සෑම වසරකම ජූලි මස 01 වන දිනට බස් ගාස්තු සංශෝධනය සිදු කළ යුතු අතර ඊට අමතරව ඉන්ධන මිල, සමස්ත කි.මී.01 ක පිරිවැය 4% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් ඉහළ නැංවීමට දායක වූ අවස්ථාවක අන්තර් වාර බස් ගාස්තු සංශෝධනය සිදු කරනු ලැබේ.

මෙම ගාස්තු ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සඳහා මේ වන විට ජාතික ගමනාගමන කොමිෂන් සභාව පියවර ගනිමින් සිටින අතර, ඒ සඳහා අත්‍යවශ්‍ය උපාංග (GPS Based mobile App) මොරටුව විශ්ව විද්‍යාලය සමග 2019.09.17 දින අත්සන් තබන ලද ගිවිසුම් ප්‍රකාරව මිලදී ගන්නා ලදී. එම GPS Based mobile App ආශ්‍රයෙන් තෝරාගත් බස් මාර්ග 100ක් සඳහා සමීක්ෂණ 2020 වසරේ ජනවාරි මස ආරම්භ කිරීමට නියමිත අතර පළාත් නිලධාරීන් පුහුණු කිරීම 2019 දෙසැම්බර් මස සිදු කරන ලදී.

සමස්ත කි.මී.01 ක පිරිවැය සැලකිය යුතු මට්ටමකින් වෙනස් නොවූ බැවින් වාර්ෂික බස් ගාස්තු සංශෝධනය 2019 වර්ෂය තුළ දී සිදු නොකළ අතර ව්‍යාපෘතිය සඳහා 2019.12.31 වන විට රුපියල් මිලියන 0.135ක මුදලක් වැය වී ඇත.

6. ප්‍රවාහනය සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්

ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් ප්‍රවාහන නියාමන කටයුතු බලතල ජාතික ගමනාගමන කොමිෂන් සභාවට ලැබී ඇත. ඒ අනුව ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධ පාර්ශවකරුවන් වන බස්හිමිකරුවන්, ප්‍රවාහන සම්බන්ධ නිලධාරීන්, පාසැල් ළමුන් හා මගීන් ආදිය පිළිබඳ දැනුවත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

<u>i) ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ අදාල බස් හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුව</u>

මගී සේවා අවසරපත්‍ර ලබා ඇති බස්රථ හිමියන් සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාව අතර, නිරන්තර සහයෝගිතාවය රඳවා ගත යුතු බැවින් සහ කොමිෂන් සභාව විසින් වරින්වර ක්‍රියාත්මක කරනු ලබන පනවනු ලබන නීති අණපනත් පිළිබඳව බස්රථ හිමියන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු සංවිධානය කල අතර ඉන් පළාත් 07 ක් 2018 වසරේ පවත්වනු ලැබූ අතර දකුණ සහ මධ්‍යම පළාත් සඳහා වැඩමුළු 02 ක 2019 වසරේදී පවත්වනු ලැබීය.





ii) ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීම ව්‍යාපෘතිය යටතේ ප්‍රවාහනයට සම්බන්ධ ඉහල නිලධාරීන් සමඟ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගැටළු සාකච්ඡා කිරීම වැඩමුළුව

පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ පවතින ගැටළු සම්බන්ධව සාකච්ඡා කිරීමට ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් මෙම වැඩමුළුව සංවිධානය කරන ලදී. මෙහි පරමාර්ථය වුයේ පොදු ප්‍රවාහනය ක්ෂේත්‍රයේ ගැටළු නිරාකරණය කරගැනීමයි. මේ සාකච්ඡාව සඳහා ගරු අමාත්‍යවරුන්ද, ප්‍රවාහන අමාත්‍ය ලේකම්තුමා, ප්‍රවාහන රාජ්‍ය ලේකම්තුමා, පළාත් ප්‍රවාහන ලේකම්වරුන්, මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරී වල සභාපතිවරුන් හා සාමාන්‍යාධිකාරීවරුන් හා ප්‍රවාහන අමාත්‍යාංශ නිලධාරීන්, ජාතික ගමනාගමන කොමිෂන් සභා නිලධාරීන් ඇතුළු ප්‍රවාහන ක්ෂේත්‍රයේ බලධාරීහු සහභාගි විය.







iii) ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීම ව්‍යාපෘතිය යටතේ පොදු ප්‍රවාහන බස්රථ සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය තැටි බෙදාදීම

පොදු මගී ප්‍රවාහන බස්රථ වල ගමන් ගන්නා මහීන්ට සෝෂාකාරී සංගීතයෙන් තොර ගීත සහ වීඩියෝ දර්ශන රසවින්දනය සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යය සංකලනයෙන් යුතු සංයුක්ත තැටි ගරු ප්‍රවාහන කළමණාකරණ අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේදී එළිදක්වන ලදී.

මෙම ගීත තැටි පළාත් ප්‍රවාහන අධිකාරී වලටද ශ්‍රීලංගම බස්රථ වලටද ලබාදීමට කටයුතු කරන ලදී. මෙම තැටි හුදෙක්ම ගීත වලට සීමා නොකර ළමා ආරක්ෂක අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය,

පරිසර අමාත්‍යාංශය වැනි රාජ්‍ය ආයතන වලින් පොදු ජනතාවට ලබා දීමට සුදානම් කර තිබූ පණිවිඩ ඇතුලත් වීඩියෝ දර්ශනද ඇතුලත් කර ඇත. ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් සම්බන්ධව මෙන්ම සාමාජීය, සෞඛ්‍යමය හා ස්වාභාව සෞන්දර්ය සම්බන්ධව පොදු ජනතාව තුල ධනාත්මක ආකල්ප වෙනසක් ඇති කිරීමට මෙම ව්‍යාපෘතිය හරහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව කටයුතු කරන ලද අතර මේ සම්බන්ධව මගී ජනතාවගේ ප්‍රසාදයද විශාල වශයෙන් ලැබෙමින් පවතී.



iv) ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීම ව්‍යාපෘතිය යටතේ ජංගම සේවා වැඩසටහන

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන මඟින් සලසනු ලබන මහජන සේවාවන් වඩාත් මහජනයාට සමීපව සහ හිතකර පරිදි සිදු කිරීම සඳහා ජංගම සේවා වැඩසටහනක් ගම්පහ සංඝබෝධි විද්‍යාලයේදී පවත්වන ලදී.





v) ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීම ව්‍යාපෘතිය යටතේ පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩමුළු

මාර්ග අනතුරුවලින් තුවාල ලබන සහ අනතුරට පත්වන ප්‍රමාණය දිනෙන් දින ඉතා ඉහල අගයක් වීම වලක්වා ගැනීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට තීරණය කරන ලදී. එහිදි නිවාරණය වඩා වැලැක්වීම වැදගත් යන තේමාව යටතේ පාසල් දරුවන් ඉලක්ක කරගනිමින් මෙම මාර්ග ආරක්ෂාව සම්බන්ධ දේශන මාලාවන් දිවයිනේ විවිධ පළාත් ආවරණය වන පරිදි සංවිධානය කරන ලදී.

2019 වර්ෂයේදි ක්‍රියාකාරී සැලැස්මට අනුව පාසල් රථ නියාමන දරුවන් පුහුණු කිරීමේ වැඩමුළු 15 පැවැත්වීමට නියමිතව තිබුණද, රට තුළ හදිසි තත්ත්වයන් මත වැඩමුළු සංඛ්‍යාව 09ක් දක්වා අඩු කිරීමට සිදුවිය. මෙම වැඩමුළු පැවැත්වීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ද මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලදි. ඒ අනුව මොණරාගල, බිබිල, කොළඹ, පස්සර, බණ්ඩාරවෙල, පුත්තලම, මාතලේ, ගම්පොළ සහ නුවරඑළිය යන ස්ථානවල පවත්වන ලදි. මෙම වැඩමුළුවලදි රථ නියාමන දරුවන් 5000 ට ආසන්න ප්‍රමාණයක් දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් කරන ලද අතර, සියලු පාසල් සඳහා රථ නියාමන කට්ටලය බැඟින් සෑම පාසලකටම පරිත්‍යාග කරන ලදි. එම පරිත්‍යාගයන් සඳහා ෆෙයාෆස්ට් ආයතනයේ අනුග්‍රාහක දායකත්වයද ලබාගන්නා ලදි.









ඊට අමතරව දෙසැම්බර් මස සබරගමුව පළාතේ පාසල් නියෝජනය කරමින් චිත්‍ර තරඟයක්ද පවත්වන ලදි. එම චිත්‍ර තරඟයෙන් ජයග්‍රහනය කරන ලද ජයග්‍රාහකයින් 201 දෙනෙක් සඳහා ත්‍යාග සහ සහතිකපත්‍ර ලබාදෙන ලදි. මෙම චිත්‍ර තරඟය සඳහා විජය පුවත්පත් ආයතනය අනුග්‍රාහක දායකත්වය ලබාදෙන ලද අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ණ දායකත්වය යටතේ විනිශ්චය කරන ලදි.





2019 වර්ෂය තුලදී මේ වෙනුවෙන් දරන ලද පිරිවැය රුපියල් මිලියන 4.734 ක් වේ.

7. අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධතිය

ජාතික ගමනාගමන කොමිෂන් සභා ප්‍රධාන හා උපකාර්යාලයීය පරිසනක පද්ධතිය හා ජාල පද්ධතිය උක්ත වර්ෂය තුළදී ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු සිදු කිරීම සාර්ථකව සිදු කළ අතර කල් ඉකුත් වූ පරිසනක හා මුද්‍රණ යන්ත්‍ර සඳහා නව පරිසනක යන්ත්‍ර සහ බහුවිධ කාර්යයන් සහිත ඡායා පිටපත් සහිත මුද්‍රණ යන්ත්‍ර යෙදවීම සිදු විය.

තවද සියළුම ක්‍රියාවලීන් හඳුනාගෙන එම ක්‍රියාවලීන් එකිනෙකට සම්බන්ධ වන ලෙස මධ්‍යගත දත්ත පාදක පද්ධතියක් ඇති කිරීමේ අරමුණෙනිව ආයතනයේ සියළුම ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරන පද්ධතියක් ස්ථාපනය කිරීම (Process Automation System) ICTA ආයතනය , මොරටුව විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාල වල උපදේශකත්වය යටතේ අදියර කිහිපයකින් ඉදිරියට යන ලෙස ආරම්භ කර 2019 වර්ෂය තුළ ඉන් පළමු හා දෙවන අදියර සර්ථකව නිම කිරීමෙන් අනතුරුව අවසාන අදියරේ 80%. සාර්ථකව අවසන් කර එය සජීවී මෙහෙයුම් කටයුතු (Live Operation) ක්‍රියත්මක කර ඇත.

එමෙන්ම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පවත්නා තොරතුරු යාවත්කාලීන කිරීම හා නව තොරතුරු ඇතුළත් කිරීමත් සෙවීම පහසු කිරීමේ ක්‍රමවේද ද හඳුන්වා දීමත් සිදු කරන ලද අතර බස් ගාස්තු පිළිබඳ දත්ත, අන්තර් පළාත් බස් රථ කාලසටහන්, අන්තර් පළාත් බස් රථ ධාවනය වන මාර්ග ඇතුළත් සිතියම්,මගී ප්‍රවාහන සේවා බලපත්‍ර සම්බන්ධ ටෙන්ඩර් පිළිබඳ තොරතුරු ඇතුළු දෑ වෙබ් අඩවිය හරහා පහසුවෙන් ලබාගත හැකි පරිදි වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම නව ප්‍රවේශයකින් යුතුව නව මුහුණු වරකින් සිදුකර ඇත.

බැස්ටියන් මාවත බස් පර්යන්තයේ සහ ප්‍රධාන බස් නැවතුම්පල 6 ක සවි කර තිබෙන විද්‍යුත් තොරතුරු පුවරු (Digital Display Boards –LED Panels) යාවත්කාලීන කර සහ නිසි පරිදි ක්‍රියාත්මක තත්ත්වයට ගෙන එය මාධ්‍ය ආයතනයක් හරහා නඩත්තු හා සේවා කටයුතු සිදු කරමින් ඉදිරියට පවත්වාගෙන යාම සාර්ථක ලෙස සිදු කරන ලදි.

බැස්ටියන් මාවත උප කාර්යාල පරිශ්‍රයේ සවිකර CCTV කැමරා පද්ධතිය නිසි ලෙස ක්‍රියා නොකරන බැවින් ඒ සඳහා නව තාකෂණයෙන් පිරිපුන් CCTV කැමරා පද්ධතියක් අදාල බස් නැවතුම්පලම ආවරණය වන පරිදි සහ වච්නියාව බස් නැවතුම්පලද ආවරණය වන පරිදි සවි කිරීම් සිදු කිරීම සාර්ථකව අවසන් කරන ලදි. තවද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය පරිශ්‍රය තුලද CCTV කැමරා පද්ධතියක් සවිකර ඇති අතර ඉහත පද්ධතින් ප්‍රධාන කාර්යාලය මගින් නිරික්ෂණය සිදු කරනු ලබයි.

මෙයට අමතරව මගී ජනතාවට ගුණාත්මක ප්‍රවාහන සේවාවක් ලබා දීමේ අරමුණෙනිව අන්තර් ජාලය ඔස්සේ (මාර්ගගත) ආසන වෙන් කිරීමේ පද්ධතියක් (Online Bus Ticket Reservation

System) මොරටුව විශ්ව විද්‍යාලය මගින් අදාල මෘදුකාංග සංවර්ධනය සිදු කර මේ වන විට හඳුන්වා දී ඇති අතර එය ජංගම දුරකථනයෙන් පහසුවෙන් සේවාව ලබා ගතහැකි පරිදි මෘදුකාංගයක් සහ ගෙවීම් සිදු කළ හැකි මාධ්‍යයන් වැඩි දියුණු කිරීමට කටයුතු කරමින් පවතී.



නූතන තාක්ෂණයේ ප්‍රතිලාභ මගී ජනතාවට ලබාදීම් සඳහා ගූගල් මැප් (Google map) හරහා ගූගල් ට්‍රාන්සිට් (Google transit) සේවාව මොරටුව විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධව හඳුන්වා දෙන ලද අතර, එමගින් පොදු ප්‍රවාහන සේවාවල ගමන්වාර සහ ගමන් මාර්ග වල දත්තයන් මෙම සේවාව හරහා පහසුවෙන් ලබා ගැනීමේ හැකියාවව ලබා දී ඇත.



තොරතුරු තාක්ෂණය හරහා මහජනතාවට ලබාදෙන පොදු සේවාවන් සම්බන්ධව 2019 වර්ෂයේ ඉ-ස්වාභිමානි (e-Swabhimani) සම්මාන උළෙලේ රාජ්‍ය අංශය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවට මාර්ගගත ආසන වෙන් කිරීමේ ව්‍යාපෘතිය සඳහා කුසලතා සම්මානයක් සහ ගූගල් ට්‍රාන්සිට් ඩේටා ස්පෙසිෆිකේෂන් (Google Transit Data Specification) ව්‍යාපෘතිය සඳහා සම්මානයක් වශයෙන් සම්මාන දිත්වයක් දිනා ගන්නා ලදි.





ව්‍යාපෘතිය සඳහා 2019.12.31 දිනට සමුච්චිත වියදම රු. මිලියන 31.117කි.

8. ප්‍රවාහන ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ

මේ යටතේ ප්‍රධාන වශයෙන් අන්තර් පළාත් බස් රථ ධාවනයට හා වෙනත් බස් සේවා ව්‍යාපෘති පුළුල් කිරීමට අදාල මගී ඉල්ලුම් සමීක්ෂණ සිදුකරනු ලැබේ. එමගින් සපයනු ලබන නිවැරදි දත්ත ක්‍රමවත් කාලසටහන් සකස් කිරීම සඳහාත් මතුවන ගැටලු අවම කරගැනීම සඳහාත් ඉවහල් වේ. මීට අමතරව අන්තර් පළාත් මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේදී හා ප්‍රතිපත්ති සකස් කිරීමේදීත්, සැලසුම් සම්පාදනය කිරීමේදීත් පවත්නා වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම මූලිකවම සිදුකරයි. ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන සිසුසැරිය, ගැමිසැරිය හා නිසිසැරිය ව්‍යාපෘති පිළිබඳ දත්ත ලබාගැනීම් සිදු කරන අවස්ථා වලදීත් සමීක්ෂණ සිදුකරනු ලබයි. ඒ අනුව පොදු ප්‍රවාහන සේවා භාවිතාකරන්නන් සහ බස්රථ ධාවකයන් යන දෙපාර්ශවයටම සාධාරණත්වය ඉටු වන පරිදි ඉල්ලුම සහ සැපයුම ප්‍රශස්ථ ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහාත් අදාල දත්ත වැදගත් සාධකයක් වේ.

2019 වසර තුළදී සිදු කරන ලද සමීක්ෂණ අතර දක්ෂිණ අධිවේගී මාර්ගයේ සහ පිටත වටරවුම් මාර්ගයේ සමීක්ෂණ විශේෂත්වයක් ගත් අතර අධිවේගී මාර්ග හරහා ධාවනය කරන අධි සුඛෝපභෝගී බස්රථ සේවාව මගී ඉල්ලුමට සරිලන පරිදි සැපයීම සඳහා බෙහෙවින් ඉවහල් විය. මීට අමතරව මහනුවර - කොළඹ, ගාල්ල - කොළඹ ආදී ප්‍රධාන මාර්ග වල ක්‍රියාත්මක බස් සේවා සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරමින් 2019 වර්ෂය තුළදී මෙම ඒකකය මගින් සමීක්ෂණ 26 ක් සිදුකර ඇත.

ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී දරන ලද මුලු වියදම රු. මිලියන 2.754 කි.

9. පොදු ප්‍රවාහනය සඳහා ජී.පී.එස්.(GPS) තාක්ෂණය උපයෝගී කරගැනීම



ජී.පී.එස්.(GPS) මෙහෙයුම්

පොදු ප්‍රවාහන සේවාවේ පැන නැඟී තිබෙන අභියෝගාත්මක ගැටළු විසඳීම පාදක කර ගනිමින් ගුණාත්මක මෙන්ම ආරක්ෂිත පොදු ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කිරීම උදෙසා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පොදු ප්‍රවාහන සේවාවට යොදා ගැනීමක් ලෙස ජී.පී.එස් . තාක්ෂණය සහ අනෙකුත් තාක්ෂණ විධි බද්ධ කරගනිමින් අන්තර්පළාත් බස් රථ නියාමනය කිරීම ප්‍රථම වරට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදි.

මෙම ව්‍යාපෘතිය යටතේ 2017 වසර තුළ ජී.පී.එස් උපකරණ අක්‍රීයව තිබූ බස් රථ නැවත ක්‍රියාත්මක කිරීම පදනම් කරගෙන අදාල ක්‍රම වේදය ප්‍රති සංවිධානය සිදු කරන ලදි.ඒ අනුව සියළුම බස් රථ වල ජී.පි.එස් උපකරණ සවි කිරීම සහ අක්‍රිය උපකරණ නැවත ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒම අදාල බස් හිමිකරුගේ වගකීමක් ලෙස බලපත්‍ර කොන්දේසි බලාත්මක කරන ලදී. 2018 වර්ෂයේදී සියලු සුඛෝපභෝගී සහ අධි සුඛෝපභෝගී බස් රථ වල ජී.පි.එස් උපකරණ ක්‍රියාත්මක තත්වයට ගෙන එන ලද අතර 2019 වර්ෂයේදී අර්ධ සුඛෝපභෝගී බස් රථ වලින් 50%ක ප්‍රමාණයක ජී.පි.එස් උපකරණ ක්‍රියාත්මක තත්වයට ගෙන එන ලදී.

එමෙන්ම නව තාක්ෂණයෙන් පිරිපුන් මෙහෙයුම් මැදිරිය මගින් ජීපීඑස් උපකරන සවිකරන ලද බස් රථ නියාමනය කිරීම සිදුවෙමින් පවතී.

මෙම උපකරණ පද්ධතිය ධාවනය වන බස් රථවල වේගය පාලනය කරමින් අනතුරු හැගවීමේ සංඥාවක් බස් රථය තුළදී නාද වීමටත් ඊට සමාන්තරව පාලන මැදිරියේ ඒ පිළිබඳව සටහන් වීමත් හේතුවෙන් මේ වන විට ජී.පී.එස්. උපකරණ ස්ථාපිත කර ඇති බොහෝ බස් රථ අධික වේගයෙන් ධාවනය කිරීම සීමා කර ඇත. මීට අමතරව මහජන පැමිණිලි ඒකකයට සම්බන්ධිත ක්ෂණික දුරකථන ඇමතුම් අංශය වෙත ලැබෙන පැමිණිලි ක්ෂණිකව විසඳීමටත් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් හැකි වී ඇත.

තවද ජීපීඑස් උපකරණ සවිකරන ලද බස් රථ වල ධාවන තත්වයන් පිලිබඳ තොරතුරු ධාවකයින් සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ඉහල නිලධාරීන් දැනුවත් කිරීම පිනිස කෙටි පනිවිඩ

සේවාවක් හදුන්වා දුන් අතර බස් රථවල ධාවන ස්ථානයන් පිලිබඳ තොරතුරු මගී ජනතාව දැනුවත් කිරීම පිනිස 1955 ක්ෂණික ඇමතුම් ඒකකය හදුන්වා දෙන ලදී.

මේ සඳහා 2019 වර්ෂය තුළ රු.මි. 3.782 ක සමුච්චිත වියදමක් දරා ඇත.

10. ආයතනික ප්‍රතිසංස්කරණ හා යටිතල පහසුකම් සංවර්ධනය

මේ යටතේ ප්‍රධාන ව්‍යාපෘති හා කාර්යයන් කිහිපයක් ඉටු කරනු ලබයි. ඒ අනුව ප්‍රාග්ධන ව්‍යාපෘති යටතේ,

- බස් නැවතුම්පළ ඉදිකිරීම හා නවීකරණය

මගීන් හා බස්රථ ධාවකයින්ගේ පහසුව පිණිස ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් බස් නැවතුම්පල ඉදිකිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ඒ අනුව 2019 වර්ෂය වන විට කිළිනොච්චිය නගරයේ ඉදිකරමින් පවතින නව බස්නැවතුම්පල 50% ක් පමණ වැඩ අවසන් කර තිබූ අතර කැබින්ට් මණ්ඩල අනුමැතියක් අනුව බකමූණ නගරයෙහි නව බස් නැවතුමක් ඉදිකිරීමට නියමිතව තිබුනි. නමුත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් පරිදි කිලිනොච්චි බස් නැවතුම් පළෙහි ඉදිරි ඉදිකිරීම් කටයුතු ද සමග ම උතුරු පළාත් සභාවට භාරදීමට මූලික සැලසුම් 2019.12.31 දින වන විට සිදු කරමින් පැවති අතර අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් පරිදි බකමූණ බස්නැවතුම් පළ ඉදිකිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවට ප්‍රතිපාදන නොමැති බව දක්වමින් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත දැනුම් දෙන ලදී.

- ජා.ග.කො.ස. ගොඩනැඟිලි අලුත්වැඩියාව
- විදුලි බලය පිරිමැසීම සඳහා ආයතනය තුළ විකල්ප බලශක්ති උත්පාදනය (සූර්ය කෝෂ)
- බැස්ටියන් මාවත හා වව්නියාව බස් පර්යන්ත අලුත්වැඩියා කටයුතු
- බැස්ටියන් මාවත බස් නැවතුම්පොළෙහි ආබාධිත පුරවැසියන් සඳහා පහසුකම් සැලසීම

යන ව්‍යාපෘතිය සඳහා 2019.12.31 දිනට රුපියල් මිලියන 12.471 ක මුදලක් වැය වී ඇත.

මීට අමතරව පුනරාවර්තන ව්‍යාපෘති යටතේ බැස්ටියන් මාවත හා වව්නියාව බස්පර්යන්ත වල සිදුකරනු ලබන බස්රථ ධාවන කටයුතු අධීක්ෂණය කිරීමත් බස්රථ වල ප්‍රමිතිය පරීක්ෂා කරමින් සේවාවේ ගුණාත්මය සතුටුදායක ලෙස පවත්වා ගැනීමත් සිදු කරනු ලැබේ.

ඒ අනුව වර්ෂයක් පාසා යෙදෙන අලුත් අවුරුදු උත්සව හා වෙසක්, පොසොන් ආදී ආගමික උත්සව පැවැත්වෙන කාලවලදීත් එම දිනවලට පෙර හා පසු දිනවලදීත් කොළඹ ඇතුළු දිවයිනේ බොහෝ ප්‍රධාන නගරවල අධික මගී ඉල්ලුමක් පවතී. මෙම තත්ත්වය කලක සිටම හඳුනාගෙන සිටින ජාතික ගමනාගමන කොමිෂන් සභාව, එම කාලවල දී විශේෂ බස්රථ සේවා යොදවමින් මගීන්ගේ

ගමනාගමන අවශ්‍යතාවයන් ඉටු කර දී ඇත. ඒ අනුව 2019 වර්ෂයේ දී විශේෂ අවුරුදු සේවා යටතේ බැස්ටියන් මාවත ප්‍රධාන නැවතුම්පොළින් පිට පළාත් වෙත දිනපතා මගීන් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් ප්‍රවාහනය කර ඇති අතර දක්ෂිණ අධිවේගී මාර්ගය ඔස්සේ බැස්ටියන් මාවත, මාකුඹුර, කඩවත, කඩුවෙල හා පානදුර යන බස් නැවතුම්පොළවලින් දිනපතා මගීන් පහළොස් දහසකට ආසන්න ප්‍රමාණයක් ද ප්‍රවාහනය කර ඇත. ඊට අමතරව උත්සව කාලසීමාව අවසන් වූ පසුව කොළඹ ඇතුළු තදාසන්න ප්‍රදේශ දක්වා පැමිණෙන මගීන් වෙනුවෙන් මොණරාගල, බදුල්ල, මහනුවර, නුවරඑළිය, හැටන් හා ඇඹිලිපිටිය යන ප්‍රදේශවලින් අමතර බස් සේවා ක්‍රියාත්මක කරන ලදී. මෙම විශේෂ බස්රථ සේවා සහ බැස්ටියන් මාවත ප්‍රධාන බස් නැතුම්පල මෙහෙයුම් හා නඩත්තු ව්‍යාපෘතිය යටතේ දුරගමන් සේවා බස්රථ සඳහා නව පිරිවිතර හඳුන්වා දීමත් ඒවා සම්බන්ධයෙන් ජංගම සේවා පවත්වා පසුවිපරම් කිරීමත් සිදු කරන ලදී. ඒ අනුව දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක ජංගම සේවා 6ක් පවත්වා බස්රථ 302ක් 2019 වර්ෂය තුළදී පරීක්ෂා කරන ලදී.

ව්‍යාපෘතිය සඳහා 2019.12.31 දිනට රුපියල් මිලියන 5.286ක මුදලක් වැය වී ඇත.

11. ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම

2009.10.14 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති 2018 වර්ෂය වන විට ක්‍රියාත්මකව පැවති ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය වත්මන් ආර්ථික, සාමාජීය අවශ්‍යතා හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ නව්‍යකරණ අවශ්‍යතා මත පදනම්ව යාවත්කාලීන කළ යුතු බව පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටුව විසින් කරන ලද නිර්දේශ හා මහපෙන්වීම පරිදි 2017 වර්ෂයේ ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කරන ලදී. එහි දායකත්වය දරමින් කමිටුව විසින් කෙටුම්පත් කරන ලද ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය භාෂා පරිවර්තනය කිරීම සහ මහජන අදහස් ලබා ගැනීම සඳහා පුවත් පත්වල පළ කිරීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් සිදු කරන ලදි. ඉන් පසුව සකස් කරන ලද ජාතික ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පත පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කර ඒ සඳහා එම කාරක සභාවේ අනුමැතිය හිමි වී ඇත. 2019.12.31 දින වන විට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

12. අන්තර්පළාත් මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම

ශ්‍රී ලංකාවේ පොදු මගී ප්‍රවාහන සේවාව නගා සිටුවීම සඳහා දැවැන්ත කාර්ය භාරයක් ඉටු කරමින් අන්තර් පළාත් පෞද්ගලික බස් මගී ප්‍රවාහන සේවාව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන අතර අන්තර් පළාත් පෞද්ගලික බස්රථ සේවාව ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීමත් මගී ප්‍රවාහන අවසරපත්‍ර නිකුත් කිරීමත් සිදු කරනු ලැබේ. අන්තර් පළාත් මාර්ගවල පොදු මගී ප්‍රවාහන සේවා සඳහා අවතීර්ණ වන බස් රථවලට මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම, ටෙන්ඩර් පටිපාටියක් ඔස්සේ සිදු කරනු ලබන අතර,

එම ක්‍රමවේදය අනුගමනය කිරීම මඟින් උපරිම විශ්වාසය හා විනිවිද භාවයකින් යුක්තව අදාල කාර්ය ඉටු කරනු ලැබේ.

අන්තර් පළාත් පෞද්ගලික බස්රථ සේවාව සේවා වර්ග 4 කින් සමන්විත වන අතර 2019.12.31 වනවිට ඒ ඒ සේවා වර්ගය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් නිකුත් කර ඇති වලංගු මගී සේවා අවසරපත්‍ර ප්‍රමාණය පහත වගුවෙහි දැක්වේ.

අනු අංකය	සේවා වර්ගය	බස්රථ සංඛ්‍යාව
1	සාමාන්‍ය	1,961
2	අර්ධ සුඛෝපභෝගී	607
3	සුඛෝපභෝගී	428
4	අධි සුඛෝපභෝගී	114
එකතුව		**3,110**

මූලාශ්‍රය - ධාවන හා සේවා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ජාගකොස

13. මහජන පැමිණිලි

පොදු බස් සේවාව භාවිතා කරන මගී ජනතාවට විශ්වාසදායී, ආරක්ෂිත මෙන්ම සුවපහසු සේවාවක් සළසා දීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ඒකායන අරමුණ වුවද අපේක්ෂිත සුභදශීලී සේවාව වෙනුවට මගී ජනතාව විවිධ අපහසුතාවයන්ට ලක්වන බව වාර්තා වේ. එබැවින් දවසේ පැය 24 පුරාම පැමිණිළි ඉදිරිපත් කිරීමට හැකිවන සේ මේ සඳහාම වෙන්වූ විශේෂ කේත අංකයක් (1955) සමඟ ක්ෂණික දුරකථන ඇමතුම් අංකයක් (0112595555) හඳුන්වා දී ඇත. ඊට අමතරව පහත ආකාරයට මහජන පැමිණිලි ඒකකය වෙත පැමිණිලි ලැබේ.

- ලිඛිතව පැමිණ භාරදෙන පැමිණිලි
- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින්
- බැස්ටියන් මාවත කාර්යාලය මගින්
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින්
- ජනපතිට කියන්න වැඩසටහන මගින්
- විද්‍යුත් තැපැල info@ntc.gov.lk මගින්
- ෆැක්ස් මගින්

<u>මහජන පැමිණිලි ඒකකය වෙත ලැබෙන ප්‍රධාන පැමිණිලි වර්ගීකරණය</u>

- වැඩිපුර ගාස්තු අය කිරීම/ ඉතිරි මුදල් ලබා නොදීම

මහජන පැමිණිලි ඒකකය වෙත ලැබෙන ප්‍රධාන පැමිණිලි වර්ගීකරණය

- වැඩිපුර ගාස්තු අය කිරීම/ ඉතිරි මුදල් ලබා නොදීම
- විධිමත් ප්‍රවේශ පත්‍රයක් ලබා නොදීම.
- කොන්දොස්තර මහතාගේ හා රියැදුරු මහතාගේ විනීත ආචාරශීලී සේවයක් ලබානොදීම.
- සුඛෝපභෝගී බස් රථයන්හි නියමිත වායු සමීකරණ තත්ත්වයන් නොමැතිවීම.
- නොසැළකිල්ලෙන් අධික වේගයෙන් බස්රථය ධාවනය කිරීම.
- කැසට් යන්ත්‍ර ගුවන් විදුලි යන්ත්‍ර වල අධික ඝෝෂකාරීව ක්‍රියාත්මක කිරීම.
- අර්ධ සුඛෝපභෝගී/ සුඛෝපභෝගී/ අධි සුඛෝපභෝගී සේවාවන් හි නියමිත ප්‍රමාණයට වඩා මගින් නංවා ගැනීම.
- අනුමැතිය නොමැති ස්ථානවල බස්රථය නවත්වා මගීන් එකතු කිරීම හා අනවශ්‍ය ලෙස ප්‍රමාදයන් සිදු කිරීම.
- බස්රථය ප්‍රවාහනයට නුසුදුසු තත්ත්වයේ පැවතීම

අනු අංකය	*විස්තරය*		*ලද පැමිණිලි සංඛ්‍යාව*	*ප්‍රතිශතය*
1	වැඩිපුර ගාස්තු අය කිරීම/ ඉතිරි මුදල් ලබා නොදීම	SE02	1118	22%
2	මගීන්ට ආචාරශීලී නොවීම	SE05	1466	29%
3	නියමිත ප්‍රමාණයට වඩා වැඩි මගීන් රැගෙන යාම	MJ09	299	6%
4	නියමිත පරිදි ප්‍රවේශ පත්‍ර නිකුත් නොකිරීම	MJ06	506	10%
5	නොසැළකිල්ලෙන් රිය පැදවීම	MJ11	569	11%
6	මාර්ග බලපත්‍ර නොමැතිව ධාවනය කිරීම	MJ05	58	1%
7	අතරමග ස්ථානවල අනවශ්‍ය ආකාරයට බස්රථය නවත්වා මගීන් එකතු කිරීම	PC02	111	2%
8	නියමිත කාලසටහන උල්ලංඝනය කිරීම	MJ02	250	5%
9	නියමිත ස්ථානයෙන් ගමන් ආරම්භ නොකිරීම හා ගමනාන්තය දක්වා ධාවනය නොකිරීම	MN02	275	5%
10	බස් රථය මගී ප්‍රවාහනයට සුදුසු තත්ත්වයේ නොතබීම	SE04	142	3%
11	වායු සමීකරණ නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම	MJ04	84	2%
12	අධික ශබ්දයෙන් කැසට්/ රේඩියෝ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම/ නොගැලෙපෙන වීඩියෝ පට ප්‍රදර්ශනය	PC01	94	2%
13	මගී ප්‍රවාහන බස්රථ අතර ඇතිවන ගැටුම්	Bus to Bus	70	1%
	එකතුව		**5042**	**100%**

මූලාශ්‍රය - තත්ව ආරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාගකොස



14. ජංගම පරීක්ෂණ හා විමර්ශනය

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාරව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව අන්තර් පළාත් මගී ප්‍රවාහන පෞද්ගලික බස්රථ සඳහා අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ. එම අවසරපත්‍ර යටතේ ධාවනය කරනු ලබන බස්රථ වෙනුවෙන් කොන්දේසි මාලාවක් පනවා ඇති අතර එම කොන්දේසි වලට අනුකූලව බස්රථ ධාවනය කරන්නේද යන්න පරීක්ෂා කිරීම, ජංගම පරීක්ෂණ ඒකකය විසින් ඉටු කරනු ලබයි. එම පරීක්ෂණ වලදී අවසරපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් අන්තර් පළාත් මාර්ගයන්හි ධාවනය කරන බවට අනාවරණය වුවහොත් අදාල බස්රථ පිළිබඳව විමර්ශනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.2019/01/01 දින සිට 2019/12/31 දින දක්වා වර්ෂය තුළ විමර්ශන ඒකකය වෙත ලැබී ඇති විමර්ශන සංඛ්‍යාව 3800 කි. එම වර්ෂය තුලදී අවසන් කරන ලද විමර්ශන සංඛ්‍යාව 3431 කි. විමර්ශනය සඳහා ඉදිරිපත් නොවූ සංඛ්‍යාව 369 කි. මගී සේවා අවසර පත්‍ර යාවත්කාලීන කරනු ලබන අවස්ථාවේදී විමර්ශනය නොකරන ලද සියළුම විමර්ශන අවසන් කිරීම සිදු කරනු ලබයි.

2019 වර්ෂය තුල සිදු කරන ලද විමර්ශන

ලැබුණු විමර්ශන වාර්තා ප්‍රමාණය	3800
අවසන් කරන ලද විමර්ශන වාර්තා ප්‍රමාණය	3431
අවසන් නොකරන ලද විමර්ශන වාර්තා ප්‍රමාණය	369
ලද විමර්ශන වාර්තා වලට අදාල කොන්දේසි කඩකිරීම් ප්‍රමාණය (MN 11 ප්‍රමාද ගාස්තු අය කිරීමේ කොන්දේසිය නොමැතිව)	5383
අවසන් කරන ලද කොන්දේසි කඩකිරීම් ප්‍රමාණය	6184
පුහුණුවට යොමු කරන ලද ප්‍රමාණය	265
රියදුරු/කොන්දොස්තර සේවය අත්හිටුවන ලද ප්‍රමාණය	238
අය කරන ලද ගාස්තු ප්‍රමාණය	**රු. 9,678.100.00**

මූලාශ්‍රය - තත්ව ආරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාගකොස



15. ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව



ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගන්නා ඉතාමත් කාලෝචිත පියවරක් ලෙස 'ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව' එළි දැක්වීම හඳුන්වාදිය හැක. ගොඩබිම, ජලය හා ගුවන් යන මාධය තුන හරහා සිදුකරන සියළු ප්‍රවාහන කාර්යයන් පිළිබඳ තොරතුරු එකම ස්ථානයකින් ලබාගතහැකි ක්‍රමයක් ලෙස 'ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව' මේ වන විට ප්‍රවාහන ක්ෂේත්‍රයේ සියළු විද්වතුන්ගේ පැසසුම් ලබන මාහැඟි ග්‍රන්ථයක් වී තිබේ. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ලංකා

වරාය අධිකාරිය, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය ඇතුළු ප්‍රවාහනය සම්බන්ධිත ආයතන රාශියකින් තොරතුරු හා දත්ත ඒකරාශී කර එම දත්ත විශ්ලේෂණය කර ඉතා ආකර්ෂණීය ලෙස සකස් කරනු ලබන මෙම 'ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව' අඛණ්ඩව වර්ෂයක් පාසා මුද්‍රිත ග්‍රන්ථයක් වශයෙන් භාෂා ත්‍රිත්වයෙන්ම එළිදක්වනු ලැබේ.

2018 වර්ෂය සඳහා වන වාර්තාව මේ වන විට සකස් කර අවසන් කර ඇති අතර මුද්‍රණ කටයුතු සඳහා යොමු කර ඇති අතර මේ වන විට ඉංග්‍රීසි මාධ්‍ය මුද්‍රණ කටයුතු අවසන් කරමින් පවතී. එමෙන්ම 2019 වර්ෂයට අදාල වාර්තාව සකස් කිරීමේ කටයුතු 50%ක් පමණ අවසන් කර ඇත.

ව්‍යාපෘතිය සඳහා 2019.12.31 දින වන විට රුපියල් මිලියන 1.621 ක මුදලක් වැය වී ඇත.

16. සේවක පුහුණුව හා සංවර්ධනය

ආයතනයක කාර්ය මණ්ඩලයේ ඵලදායීතාව, සමස්ථ කාර්යාවලියෙහි ගුණාත්මක බව ඉහළ නැංවීම කෙරෙහි ඉතා ප්‍රබල පිටිවහලක් සපයයි. එබැවින් ආයතනයේ සේවක මණ්ඩලය විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ නිපුනභාවයට පත් කිරීම, දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා තුළින් සිදු කරනු ලැබේ. එලෙසින් ජාතික ගමනාගමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම තුලින් ආයතනයට අවශ්‍ය වන්නාවූ දැනුම හා කුසලතා වලින් පිරිපුන් සේවක මණ්ඩලයක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ. මේ යටතේ 2019 වර්ෂය තුළ විදේශ පුහුණු සඳහා සේවකයින් තිදෙනෙකු පමණක් යොමු කරවූ අතර, ඒ සඳහා රුපියල් මිලියන 1.70ක වියදමක් දරා ඇත.

17. පෙරගෙවුම් කාඩ් ක්‍රමය (Electronic Fare Collection)

පොදු ප්‍රවාහන සේවා භාවිතා කරන මගීන් වෙත විශ්වාසදායී හා කාර්යක්ෂම සේවාවක් තහවුරු කිරීමත්,ප්‍රවේශ පත්‍ර ලබාගැනීමේදී මගීන් පත්වන අපහසුතා අවම කිරීමත්, බස්රථ ධාවකයාගේ ආදායම සුරක්ෂිත කිරීමත් අරමුණු කරමින් ප්‍රවේශපත්‍ර ගාස්තු ගෙවීම සඳහා පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2016.02.26 දින MTCA/18/2016 අංක දරණ කැබිනට් අනුමැතියක් ලබාදෙන ලදී.

ඒ අනුව ඊට සම්බන්ධ පාර්ශවකාර ආයතන වලින් සැදුම්ලත් විද්වත් කමිටුවක් පත් කර ඇති අතර 2019.12.31 දින වන විට එම කමිටුව රැස්වීම් වාර 12 ක් පවත්වා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා මහබැංකුව යටතේ ලියාපදිංචි වී ඇති වාණිජ බැංකු වලට පෙරගෙවුම් කාඩ්පතක් නිකුත් කිරීම සඳහා සුදානම් වීමට සැලකිය යුතු කාලයක් අවශ්‍ය බව පවසා සිටි බැවින් ඒ සඳහා කාලය ලබාදුන් අතර මේ වන විට ලංකා බැංකුව විසින් සකස් කර ඇති කාඩ්පත දැනට බස්රථ හිමියන් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සඳහා භාවිතා කරන යන්ත්‍ර වල භාවිතා කිරීමේ හැකියාව තහවුරු කරගනිමින් පවතී

ව්‍යාපෘතිය සඳහා 2019.12.31 දිනට රුපියල් මිලියන 0.008ක මුදලක් වැය වී ඇත.

18. කෙටි විවේක ස්ථාන (Resting Stop)

දුරගමන්සේවා බස්රථ වල ගමන් ගන්නා මගීන්ට කෙටි ආහාර ලබා ගැනීම සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සඳහා බස්රථ නවත්වනු ලබන ආපන ශාලා ඉතාමත් අපිරිසිදු සහ අඩු පහසුකම් පවතින බව නිරන්තරයෙන් මගීන්ගෙන් පැමිණිලි ලැබේ. එයට පිළියමක් වශයෙන් මෙම දුර ගමන් සේවා බස්රථ නවත්වන ආපන ශාලා වල තත්ත්වය සෞඛ්‍යාරක්ෂිත මට්ටමකට පත්කිරීමේ අරමුණින් 2019 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ඒ අනුව දැනට පවත්නා ආපන ශාලා වල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා සමීක්ෂණයක් කොළඹ - අනුරාධපුර , කදුරුවෙල , ත්‍රිකුණාමලය මාර්ග අවරණය වන ලෙස සිදු කරන ලදී. මෙම සමීක්ෂණය නියමු ව්‍යාපෘතියක් ලෙස සිදු කරන ලද අතර පරීක්ෂා කරන ලද ආපන ශාලාවලින් බොහොමයක් ඉතා අඩු පහසුකම් යටතේ පවතින බවත්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කරනු ලබන වර්ගීකරණය අනුව C ශ්‍රේණියේ පවතින බවත් තහවුරු කර ගන්නා ලදී. ඒ අනුව එම පරීක්ෂා කරන ලද ආපන ශාලාවල හිමියන් කැඳවා එම ආපන ශාලාවල තත්ත්වය සෞඛ්‍ය අමාත්‍යාංශ වර්ගීකරණය අනුව B හෝ A ශ්‍රේණියට පත්කරගන්නා ලෙසත් එසේ පත්කර අදාළ සහතිකය ජාතික ගමනාගමන කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසත් දන්වා සිටින ලදී. එසේ ඉදිරිපත්වන ආපන ශාලා වල ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ ක්‍රියාත්මක ආයතනයක් බව සඳහන් කරන බවත් එමගින් සියලුම දුර සේවා බස්රථ එම ස්ථාන වල පමණක් නැවැත්වීමට අවසර දෙන බවත් ආපන ශාලා හිමියන් දැනුවත් කරන ලදී. නමුත් කිසිදු ආපන ශාලා හිමියෙකු 2019.12.31 දින තෙක් ඉදිරිපත් නොවූ බැවින් මේ සඳහා වෙනත් විකල්ප ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව හඳුනාගන්නා ලදී. ඒ අනුව එම නව ක්‍රමවේදය අනුව 2020 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. ඊට සම්බන්ධ පාර්ශවකාර ආයතන සමග සාකච්ඡා කර මෙම ආපන ශාලාවල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා නව ක්‍රමවේදයක් මේ වන විට සකස් කරමින් පවතී. මේ ව්‍යාපෘතිය සඳහා 2019.12.31 දින වන විට රුපියල් මිලියන 0.19 ක මුදලක් වැය වී ඇත.

වාර්ෂික ගිණුම්

ජාතික ගමනාගමන කොමිෂන් සභාව *(ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	සටහන්	**2019**	**2018**
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත සහඋපකරණ	**4**	433,879,229.25	439,444,502.62
නොනිමි වැඩ		30,674,726.89	14,241,880.44
පුස්තකාල පොත්		1,269,973.81	1,177,108.81
මුලු ජංගම නොවන වත්කම්		**465,823,929.95**	**454,863,491.87**
ජංගම වත්කම්			
ලැබීම්, තැන්පතු සහ අත්තිකාරම්	**5**	8,094,632.72	3,773,484.31
ලැබීම් - සේවක	**6**	24,378,163.00	22,862,775.00
ආයෝජන -කාලීන තැන්පත්	**7**	38,317,490.30	34,890,548.09
ආයෝජන භාණ්ඩාගාර - බිල්පත්	**8**	13,823,174.00	12,707,047.00
පොළී ආදායම් ලැබීම්		3,543,592.69	3,426,181.97
මුදල් හා මුදල්සමාන දෑ	**9**	532,294,890.61	454,002,393.91
මුලු ජංගම වත්කම්		**620,451,943.32**	**531,662,430.28**
මුලු වත්කම්		**1,086,275,873.27**	**986,525,922.15**
බැරකම්			
ජංගම නොවන බැරකම්			
රජයේ ප්‍රතිපාදන	**10**	267,821,299.86	295,050,931.97
පාරිතෝෂික වෙන්කිරීම්	**11**	45,668,232.50	40,817,143.00
මුලු ජංගම නොවන බැරකම්		**313,489,532.36**	**335,868,074.97**
ජංගම බැරකම්			
ගෙවිය යුතු වියදම්	**12**	62,625,997.02	63,348,905.04
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		59,703,404.00	65,718,904.00
වෙන්කිරීම් හා උපචිත වියදම්	**13**	37,857,056.79	37,369,501.43
මුලු ජංගම බැරකම්		**160,186,457.81**	**166,437,310.47**
සමුච්චිත අරමුදල		**612,599,883.10**	**484,220,536.71**
මුලු ශුද්ධ වත්කම් / හිමිකම්		**1,086,275,873.27**	**986,525,922.15**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍යාංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වලට අනුකූලව පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කර ඇති බවටසහතික කරන ලදී.

.....

අධ්‍යක්ෂ (මුදල් හා ප්‍රසම්පාදන)

මූල්‍ය ප්‍රකාශන වල අංක 05 සිට 08 දක්වා පිටු වල දක්වා ඇති මූල්‍ය ප්‍රතිපත්ති හා අංක 09 සිට 15 දක්වා පිටු වල දක්වා ඇති සටහන් වලට අනුගතව සකස් කර ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වගකියනු ලැබේ.

.....

සභාපති

.....

කොමිෂන් සභාවේ සාමාජික

දිනය: 2020.06.03

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

(ශ්‍රී ලංකා රුපියල් වලිනි)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් කාර්යඵලය පිළිබඳ

ප්‍රකාශය	සටහන්	2019	2018
ආදායම			
ආදායම	**14**	412,964,651.71	418,679,359.10
වෙනත් අදායම්	**15**	68,912,998.09	66,991,441.14
එකතුව		**481,877,649.80**	**485,670,800.24**
වියදම්			
මෙහෙයුම් වියදම්	**16**		
සේවක පාරිශ්‍රමික	**16.1**	151,223,387.86	138,506,393.93
ප්‍රවාහන වියදම්	**16.2**	17,686,303.64	19,482,574.78
විශේෂ රැස්වීම් සඳහා වියදම්		39,000.00	166,000.00
ප්‍රවාහන සංවර්ධන කාර්යයන්	**16.3**	3,791,447.98	4,426,999.95
ගමන් වියදම් සහයැපීම් දීමනා	**16.4**	49,423,879.68	47,560,545.84
ස්ථාවර වත්කම් අලුත්වැඩියා සහ නඩත්තු	**16.5**	2,987,729.82	2,156,067.29
සේවක සුභසාධනය	**16.6**	12,209,422.63	9,759,278.93
කාර්ය මණ්ඩල සංවර්ධනය	**16.7**	1,148,026.35	2,764,349.57
නීති හා වෙනත්ගාස්තු	**16.8**	2,689,811.00	1,450,647.50
සන්නිවේදන වියදම්	**16.9**	1,119,008.75	2,622,542.25
ක්ෂය වීම්	**16.10**	25,429,851.72	21,122,388.41
මුල්‍යාගාස්තු	**16.11**	51,186.52	47,178.38
සේවක පාරිශ්‍රමික	**16.12**	447,151.50	583,757.50
මුලු මෙහෙයුම් වියදම්		**268,246,207.45**	**250,648,724.33**
වර්ෂය සඳහා අතිරික්තය (ඌණකාවය)		**213,631,442.35**	**235,022,075.91**
මෙහෙයුම් නොවන ආදායම්	**17**	**40,175.00**	**129,240.00**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය (ඌණකාවය)		**213,671,617.35**	**235,151,315.91**
රජයෙන්ලැබුණු ප්‍රතිපාදන			
ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රතිපාදන ලැබීම්	**18**	**581,750,000.00**	**400,000,000.00**
විශේෂ ව්‍යාපෘති වියදම් (රජයේ ප්‍රතිපාදන)	**19.1**	**(581,750,000.00)**	**(400,000,000.00)**
විශේෂ ව්‍යාපෘති වියදම් (ජාගකොස ප්‍රතිපාදන)	**19.2**	**(35,292,270.96)**	**(69,946,252.92)**
වර්ෂය සඳහා අතිරික්තය (ඌණකාවය)		**178,379,346.39**	**165,205,062.99**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව *(ශ්‍රී ලංකා රුපියල්වලිනි)*

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/හිමිකම වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අතිරික්තය (ඌනතාවය)
2018 ජනවාරි 01 දිනට ශේෂය	319,015,473.72
අදාල වසර සඳහා අතිරික්තය / ඌණතාවය	165,205,062.99
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	484,220,536.71
භාණ්ඩාගාරය වෙත හරවා යවන ලද මුදල්	50,000,000.00
අදාල වසර සඳහා අතිරික්තය /ඌණතාවය	178,379,346.39
2019දෙසැම්බර් 31 දිනටශේෂය	612,599,883.10

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

ජාතික ගමනාගමනකොමිෂන් සභාව

(ශ්‍රී ලංකා රුපියල් වලිනි)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2019	2018
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
වසර සඳහා අතිරික්තය ඌණතාවය /		178,379,346.39	165,205,062.99
මුදල් නොවන වලනයන්			
ක්ෂය වීම්		25,429,851.72	21,122,388.41
වත්කම් අපහරණය		(40,175.00)	(129,240.00)
ක්‍රමක්ෂය		(27,229,632.11)	(27,256,269.29)
වසර සඳහා පාරිතෝෂික වියදම		7,744,054.50	4,035,786.25
පොළී අදායම		(41,683,365.98)	(39,735,171.85)
මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට - පෙරකාරක ප්‍රග්ධනයේ වෙනස්වීම්		**142,600,079.52**	**123,242,556.51**
ලැබීම්, තැන්පතු සහ අත්තිකාරම්		(4,321,148.41)	85,648.62
ලැබීම් - සේවක		(1,515,388.00)	(2,520,777.00)
පොළී ආදායම		(117,410.72)	(1,672,839.94)
ගෙවීම්		(722,908.02)	7,808,182.87
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		(6,015,500.00)	17,783,500.00
වෙන්කිරීම් හා උපචිත වියදම්		487,555.36	(68,575,235.72)
මෙහෙයුම් වලින් ජනිත වූ මුදල්		**130,395,279.73**	**76,151,035.34**
පාරිතෝෂික අරමුදල් ගෙවීම්		(2,892,965.00)	(307,360.00)
වත්කම් අපහරණයෙන් ලද මුදල්		40,175.00	129,240.00
මෙහෙයුම්ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල්		**127,542,489.73**	**75,972,915.34**
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම		(19,864,578.35)	(34,789,256.55)
පුස්තකාල පොත් අත්පත් කර ගැනීම		(16,432,846.45)	(14,241,880.44)
කාලීන තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත් සඳහා ශුද්ධ ආයෝජන		(92,865.00)	(99,999.00)
පොළී ලැබීම්		(4,543,069.21)	(4,263,410.93)
දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම		41,683,365.98	39,735,171.85
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		**750,006.97**	**(13,659,375.07)**
මූල්‍ය ක්‍රියාකාරීත්වය තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම්		(50,000,000.00)	(100,000,000.00)
වර්ෂය තුළ මූල්‍ය ක්‍රියාකාරීත්වය තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**(50,000,000.00)**	**(100,000,000.00)**
වර්ෂය තුළ මුදල් හා මුදල් සමාන දෑනි ශුද්ධ වෙනස		**78,292,496.70**	**(37,686,459.73)**
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ		454,002,393.91	491,688,853.64
වර්ෂ අවසාන මුදල් සහ මුදල් සමාන දෑ	**සටහන 9**	**532,294,890.61**	**454,002,393.91**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 **ඒකාබද්ධ තොරතුරු**

1.1 වාර්තාකරන ආයතනය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 1991 අංක 37 දරණ ජාගකොස පනත යටතේ ස්ථාපනය කොට ඇත. කොමිෂන් සභාවේ කාර්යාලය සහ ගණුදෙනු සිදුකරනු ලබන ප්‍රධාන මධ්‍යස්ථානය කොළඹ 05 , උද්‍යාන පාරේ අංක 241 දරන ස්ථානයෙහි පිහිටුවා ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්හී ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍යමය දත්ත ඇතුලත් වේ

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් වල ස්වභාවය
කොමිෂන් සභාවේ කාර්යය වනු ඇත්තේ ඔමිනි බස් මගින් මගී ජනතාවට ප්‍රවාහන සේවාවන් සැලසීම පිළිබඳව ශ්‍රී ලංකා රජයට උපදෙස් ලබාදීම සහ ඔමිනි බස් සඳහා නිශ්චය කර ගනු ලබන ප්‍රදේශ සඳහා මගී ප්‍රවාහන සේවා බලපත්‍ර නිකුත් කිරීම වේ.

1.3 2019 වර්ෂය අවසානය වන විට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ස්ථිර සේවක මණ්ඩලය 188 කි. එමෙන්ම කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 8 දෙනෙකු සේවය කර ඇත..

1.4 වාර්තාකරන දිනය
කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ දිනය දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වේ.

1.5 නිකුත් කිරීම සඳහා බලයලත් දිනය
කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය / සාමාජිකයින් විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධිකාරී බලය ලබා දී ඇත්තේ 2020.06.03 දිනය.

2 වැදගත් ගිණුම්කරන පිළිවෙත්හි සාරාංශය

2.1 පිළියෙල කිරීමේ පදනම
කොමිෂන් සභාවේ ගිණුම් පිළියෙල කරනු ලබන්නේ රාජ්‍ය අංශයේ ගිණුම් පිළිබඳ ප්‍රමිතීන් (SLPSASs) සහ පොදුවේ පිළිගනු ලබන ගිණුම්කරණ මූලධර්ම (LKAS 20) වලට අනුකූලවය. මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත්තේ ගත්මිල මත පදනම්ව වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා රජයේ ගිණුම් පිළිවෙත් අනුව ඇස්තමේන්තු මත සකස් කර ඇත.
ඉහත සඳහන් ක්‍රියාවලි අනුව ආයතනයේ තොරතුරු, සටහන්, ඇස්තමේන්තු ගිණුම්ගත කිරීමේදී ගිණුම්කරණ ක්‍රියාවලියෙන් පරිබාහිර, විශේෂිත හා සංකීර්ණ වූ අවස්ථාවන් ගිණුම්කරණයට ලක් කිරීමේදී එම අවස්ථාවට යොදාගනු ලබන උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳව සටහන් අංක 3 මගින් දක්වා ඇත.

2.2 ගිණුම් පිළිවෙත් වල වෙනස්කිරීම්
පහත සඳහන් කර ඇති මූල්‍ය ප්‍රකාශන වල වෙනස්කම් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන කාල සීමාව සඳහා ක්‍රමාණුකූලව සඳහන් කර ඇත.

පවත්නා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා සසඳමින් වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම අදාල තැන්හි සංශෝධනය කර ඇත.

2.3 විදේශ විනිමය පරිවර්තනය

2.3.1 මෙහෙයුම් සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය
මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇති ගණුදෙනු සහ ශේෂය මනිනු ලබන්නේ ආයතනය මෙහෙය වනු ලබන ප්‍රාථමික ආර්ථික පරිසරය අනුවය. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.3.2 ගණුදෙනු සහ ශේෂය
විදේශ විනිමය ගණුදෙනු ක්‍රියාකාරකම් විනිමය ගණුදෙනු බවට පරිවර්තනය කරනුයේ ගණුදෙනු කරන දිනයේ පවත්නා විනිමය අනුපාතය මතය.

2.4 දේපළ පිරියත උපකරන පිරිවැය
දේපළ පිරියත උපකරන පිරිවැය යනු මිලදී ගැනීමේ පිරිවැය හෝ ඉදිකිරීම සඳහා දරන ලද වියදම් වත්කම අපේක්ෂිත කාර්යය සඳහා ක්‍රියාත්මක තත්වයට දැරූ වියදම වේ .දේපළ පිරියත සහ යන්ත්‍ර උපකරණවල වටිනාකම දක්වන විටදී එය මිලදී ගැනීමට දැරූ මූලික වියදමින් මෙතෙක් ක්ෂයවීම් හා හානි අඩුකිරීමෙන් පසු ශුද්ධ වටිනාකම දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට.....

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට.....

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීමේ, වැඩිදියුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ වියදම් හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමේ තත්ත්වයට පත් කිරීම දක්වා ගිණුම් වත්කම් තීරණය ලෙස සළකා ඇත. වත්කම් වලට අදාල නඩත්තු කිරීම් හා අලුත්වැඩියා කිරීම් වියදම් අදාල ආදායම් වියදම් ගිණුමට ලියාහැර ඇත.

ඉඩම් වටිනාකම ක්ෂයකිරීමට ලක් නොවන අතර අනෙකුත් වත්කම් ක්ෂයකිරීමට ලක් කිරීමේදී සරළ රේඛීය ක්ෂය ක්‍රමය යොදාගෙන ඇත. අදාල වත්කම් වල ආයුකාලය පහත පරිදි ගෙන ඇත.

වත්කම් වර්ගය	අවුරුද්ද
මෝටර් වාහන	වර්ෂ 05 තුල
ලී බඩු සහ සවිකිරීම්	වර්ෂ 10 තුළ
කාර්යාල උපකරණ	වර්ෂ 05 තුල
විවිධ උපකරණ	වර්ෂ 05 තුල
පරිගණක සහ මුද්‍රන යන්ත්‍ර	වර්ෂ 04 තුල
යන්ත්‍ර	වර්ෂ 05 තුල
ගොඩනැගිලි	වර්ෂ 20 තුල
විද්‍යුත් උපකරණ (LED)	වර්ෂ 03 තුල

වත්කම් වල පොත් අගය එහි ඇස්තමේන්තුගත උපයා ගතහැකි අගයට වඩා වැඩි අගයක් ගන්නේ නම් එම වත්කම් වල පොත් අගය වහාම උපයාගත හැකි අගයට ලියාහරිනු ලැබේ.

2.4.1 භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් මත කරන ආයෝජන
භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් සහ කාලීන තැන්පතු පිරිවැය අනුව සඳහන් කර ඇත.

2.6 ලැබීම්
ලැබීම් යනු ලබාගන්නා ලද සේවාවන් සඳහා ගෙවීමට ඇති මුදල් වේ. එකතුව සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දී බලාපොරොත්තු වන අතර ලැබීම් වර්ගීකරණය කරනුයේ ජංගම වත්කම් ලෙසය. ලැබීම් හඳුනාගැනීම සහ මනිනු ලබන්නේ ගණුදෙනු කරන කරන වටිනාකම /අගය මතය.

2.7 මුදල් හා මුදල් සමාන දෑ
මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් සහ මුදල් සමාන දෑ වශයෙන් හඳුන්වා ඇත්තේ අතැති මුදල්, බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු , බැංකුවල ඇති ක්ෂණික /ස්ථාවර තැන්පතු සහ පාරිතෝෂික අරමුදල්ය

2.8 ගෙවීම්
ගෙවීම් යනු භාණ්ඩ හා සේවා සපයන්නන් ලබාගත් භාණ්ඩ හා සේවා සඳහා අවශ්‍යයෙන් කළයුතු ගෙවීම් වේ. ගෙවීම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් කාලචක්‍රයේ කළ යුතු ගෙවීමක් නම් එය ජංගම වත්කමක් ලෙස වර්ග කරනු ලැබේ. (වසර 1 ක් හෝ ඊට අඩු) එසේ නොමැති අවස්ථාවල ඒවා ජංගම නොවන වත්කම් ලෙස හඳුන්වනු ලැබේ.
ගෙවීම් මූලික වශයෙන් හඳුනාගනු ලබන්නේ ගණුදෙනු කරන මිලට අනුව වන අතර ඉන් පසුව ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී මෙම මිලට මිණුම් කරනු ලැබේ.

2.9 රජයේ ප්‍රතිපාදන
මූල්‍ය නොවන ප්‍රතිපාදන ඇතුලත්ව රජයෙන් ලැබෙන ප්‍රතිපාදන ඒවායෙහි සාධාරන වටිනාකම් අනුව හඳුනාගනු ලැබේ.

දේපළ පිරියත සහ උපකරණ වලට අදාල රජයේ ප්‍රතිපාදන ජංගම නොවන වත්කම් වල රජයේ විලම්භීත ප්‍රතිපාදන යටතට ඇතුලත් කර ඇති අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේදී මෙය හඳුනාගනු ලබන්නේ අදාල වත්කම් වල අපේක්ෂිත ආයු කාලයේ සරළ රේඛීය පදනම් මතය.

මූල්‍ය නොවන ප්‍රතිපාදන මූල්‍ය නොවන වත්කමෙහි ධාරණ වටිනාකම් අනුව ගණනය කරනු ලබන අතර ධාරණ වටිනාකම් අනුව ප්‍රතිපාදන ලබාදීම සහ වත්කම් ගණනය කරනු ලැබේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.10 මිලදී ගැනීමේ පිරිවැය

මුදල් කාර්යාලය පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීමේ පිරිවැය හඳුනාගනු ලබන්නේ මිලදී ගන්නා ලද කාලය තුලය.

2.11 සේවක ප්‍රතිලාභ

කොමිෂන් සභාවට නිශ්චිත ප්‍රතිලාභ සහ නිශ්චිත දායකත්වය පිළිබඳ සැළසුම් ඇත

(a) නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැළැස්මක් යනු කොමිෂන් සභාව මගින් ස්ථාවර දායකත්ව මුදලක් වෙනම අස්ථිත්වයක් වෙත ගෙවනු ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මකි. මෙය පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මක් බැවින් තවදුරටත් ඒ සඳහා දායකත්ව මුදලක් ගෙවීම සඳහා කොමිෂන් සභාවට භෞතික හෝ අධියාත්මික බැඳීමක් නොමැත. කල් පිරුණු පසු මෙම දායකත්ව මුදල් සේවක ප්‍රතිලාභ වියදම් වශයෙන් හඳුන්වනු ලැබේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් එක් සේවකයෙකුගෙන් දළ පාරිශ්‍රමික මුදලක් ලෙස 15% ක් බැර කරනු ලබන අතර සේවා නියුක්ති භාරකාර අරමුදලට 3% දළ පාරිශ්‍රමිකයක් අය කරනු ලැබේ.

(b) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

සේවකයාගේ සේවා පළමු වර්ෂයේ සිට සේවය කරනු ලබන සෑම වර්ෂයකම මාස ½ ක චේතනය සේවක පාරිතෝෂික අරමුදලට බැර කිරීමට කටයුතු යොදා ඇත. කෙසේ වෙතත් 1983 පාරිතොෂික අරමුදල ගෙවීමේ පනත් අංක 12 අනුව සේවකයෙකුට පාරිතෝෂික අරමුදලට හිමිකම් ලබාගත හැක්කේ වර්ෂ 05 අඛණ්ඩ සේවාවක් කිරීමෙනි.

(c) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ පිළිබඳ වගකීම මනිනු ලබන්නේ සේවකයින් විසින් ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් ගෙවීමට අපේක්ෂිත වට්ටම් හෝ කරන ලද මුදලමය වටිනාකම් මතය

2.12 ප්‍රතිපාදන සහ අවිනිශ්චිත වගකීම්

මෙහෙයුම් වියදම් සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලබන්නේ අතීතයේ සිදුකරන ලද සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් කොමිෂන් සභාවට වර්තමානයේ ඇති නෛතික බැඳීම් හෝ කොමිෂන් සභාවට අවශ්‍ය ආර්ථික සම්පත් පිටතට ගලායෑම සිදුවිය හැකි අතර විශ්වසනීය ලෙස එම ප්‍රමාණයන් ඇස්තමේන්තු ගත කල හැකිය.

පදනම් කරගෙන දැනට පවත්නා බැඳීමද වගකීම් පියවීම / නිරවුල් කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම් අනුව ප්‍රතිපාදන මනිනු ලැබේ.

සියලුම අස්ථාවර වගකීම් මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහනක් ලෙස එළිදරවු නොකළහොත් සම්පත් පිටතට ගලායාමේ හැකියාව දුරස්ථ වනු ඇත.

2.13 ආදායම් හඳුනාගැනීම්

ආර්ථික ප්‍රතිලාභ සත්‍ය වශයෙන්ම ආයතනයට ගලා එන අවස්ථාවේදී ආදායම් වශයෙන් හඳුනාගැනීම්. කොමිෂන් සභාව අදායම් හඳුනාගනු ලබන්නේ ආදායම් ප්‍රමාණය සත්‍ය වශයෙන්ම මැනිය හැකි අවස්ථාව සහ ඉදිරියේදී කොමිෂන් සභාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි සම්භාවිතාව අනුවය.

කොමිෂන් සභාව විසින් ආදායම් හඳුනාගැනීම් සඳහා පහත දැක්වෙන නිර්ණායක හඳුනාගත හැක. ඒ ඒ ප්‍රධාන මාර්ග වල ආදායම් මැනීම් සඳහා ආදේශ කර ඇත.

(a) **බලපත්‍ර ආදායම්**

මාර්ග බලපත්‍ර වලින් ලැබෙන අදායම් හඳුනාගනු ලබන්නේ කොමිෂන් සභාව වෙත අනාගතයේ ආර්ථික ප්‍රතිලාභ සැලැස්මට ඇති හැකියාව මතය.

(b) දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමේදී ඇති ලාභ සහ අලාභ

බැහැර කිරීමේදී ඇති ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ලත් මුදල් / උත්පාදන මුදල් ධාරන පිරිවැයත් සමඟ සන්සන්දනය කිරීමෙනි. මෙය මුදල් කාර්යාල ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

2.14 වියදම්

මෙහෙයුම් කරන කාලසීමාවෙදී දරන ලද වියදම් යනු වාර්තාකරන කාලයේදී ලාභය ලෙස ලැබෙන ආදායමයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට.....

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.15 ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සිදුවීම්

ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදුවන ද්‍රව්‍යමය සිදුවීම් සැලකිල්ලට ගනු ලබන අතර මූල්‍ය ප්‍රකාශයෙහි අවශ්‍ය තැන්වල සුදුසු පරිදි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

2.16 වගකීම්

ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සියලුම ද්‍රව්‍යමය වගකීම් හඳුනාගෙන ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශයෙහි සටහන් කිරීම මඟින් අනාවරණය කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ පිළිවෙත් (නිමාන) සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී කළමණාකාරීත්වය මඟින් විනිශ්චයන් ගණනාවක් යොදාගනු ලබන අතර වත්කම්, වගකීම්, ආදායම සහ වියදම හඳුනාගැනීම සහ මැනීම සඳහා තක්සේරු (නිමාන) සහ උපකල්පන රාශියක් උපයෝගී කරගනු ලබයි. මැනීමට යන හඳුනාගැනීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකරන තක්සේරු /පළාත් සහ උපකල්පන පිළිබඳ තොරතුරු පහත දක්වා ඇති පරිදි වේ:

(a) **ක්ෂය වීගෙන යන වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය**

වත්කමේ අපේක්ෂිත ආර්ථික උපයෝගීතාවය මත ශේෂ පත්‍ර දිනයට ක්ෂය වන වත්කමෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තක්සේරු කරනු ලබන බව කළමණාකාරීත්වය සමාලෝචනයෙහි දක්වා ඇත. මෙම අස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයන්ට හේතුව ඇතැම් මෘදුකාංග හා තොරතුරු තාක්ෂණික උපාංග වල උපයෝගීතාවය වෙනස් කිරීමට ඉවහල් වන යල්පැන ගිය තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට.....

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

4. දේපළ පිරියත සහ උපකරණ

සින්නක්කර වත්කම් - පිරිවැය

අංක	වත්කම් පංතිය	පිරිවැය				ක්ෂය ප්‍රතිශතය	ක්ෂය කිරීම්				ශේෂය 2019	ශේෂය 2018
		2019 01.01. දිනට ශේෂය	අපහරනය කිරීම්	වසර තුළදී එකතුකිරීම්	2019 12.31.දිනට ශේෂය		2019 01.01.දිනට ශේෂය	අපහරනය කිරීම්	වසර තුළදී එකතුකිරීම්	2019 12.31.දිනට ශේෂය		
1	ඉඩම්	245,000,000.00	-		245,000,000.00	-	-	-	-	-	245,000,000.00	245,000,000.00
2	ගොඩනැගිලි	191,388,523.04	-	7,076,377.59	198,464,900.63	5%	60,522,007.38	-	9,626,782.71	70,148,790.09	128,316,110.54	130,866,515.66
3	මෝටර් වාහන	75,547,270.00	-	-	75,547,270.00	20%	66,459,249.10	-	2,250,000.00	68,709,249.10	6,838,020.90	9,088,020.90
4	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	35,373,072.05	64,206.75	375,285.62	35,684,150.92	10%	20,490,224.05	64,206.75	3,037,376.03	23,463,393.33	12,220,757.59	14,882,848.00
5	කාර්යාල උපකරණ	23,991,203.38	**191,476.00**	1,506,723.75	25,306,451.13	20%	11,167,727.51	191,476.00	2,883,035.44	13,859,286.95	11,447,164.18	12,823,475.87
6	විවිධ උපකරණ	8,387,999.80	60,323.00	613,760.75	8,941,437.55	20%	3,338,003.70	60,323.00	1,316,217.72	4,593,898.42	4,347,539.13	5,049,996.10
7	පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	58,316,340.09	932,172.80	10,292,430.64	67,676,597.93	25%	36,583,154.40	932,172.80	6,315,979.42	41,966,961.02	25,709636.91	21,733,185.69
8	යන්ත්‍රෝපකරණ	1,775,637.00	-	-	1,775,637.00	20%	1,775,176.60	-	460.40	1,775637.00	-	460.40
9	විදයුත් ප්‍රදර්ශන නාමපුවරු	62,415,360.00	-		62,415,360.00	33.33%	62,415,360.00	-	-	62,415,360.00	-	-
එකතුව		**702,195,405.36**	**1,248,178.55**	**19,864,578.35**	**720,811,805.16**		**262,750,902.74**	**1,248,178.55**	**25,429,851.72**	**262,671,403.34**	**433,879,229.25**	**439,444,502.62**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව *(ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		**2019**	**2018**
5 **ලැබියයුතු, තැන්පතු සහ අත්තිකාරම්**			
ලැබියයුතු	සටහන **5.1**	6,309,801.67	2,020,007.50
තැන්පතු සහ අත්තිකාරම්	සටහන **5.2**	1,784,831.05	1,753,476.81
		8,094,632.72	**3,773,484.31**
5.1 ලැබියයුතු			
		5,970,615.50	2,020,007.50
ලැබිය යුතු ආදායම්		83,898.00	-
මැතිවරණ දෙපාර්තමේන්තුව		255,288.17	-
වෙනත් ලැබිය යුතු			
		2,020,007.50	**2,020,007.50**
5.2 තැන්පතු සහ අත්තිකාරම්			
තැන්පතු		686,500.00	686,500.00
අත්තිකාරම් - ව්‍යාපෘති		37,616.00	2,457.00
අත්තිකාරම් - ජාගකොස		55,000.00	37,084.40
අත්තිකාරම් ගෙවීම්		1,005,715.05	1,027,435.41
		1,784,831.05	**1,753,476.81**
6 **ලැබියයුතු - සේවක**			
ආපදා ණය		23,383,870.00	21,422,735.00
ආපදා ණය		214,593.00	786,840.00
රෙදිපිළි සඳහා අත්තිකාරම්		469,200.00	410,200.00
උත්සව අත්තිකාරම්		310,500.00	243,000.00
		24,378,163.00	**22,862,775.00**
7 **ආයෝජන -කාලීන තැන්පතු**			
කාලීනතැන්පතු		38,317,490.30	34,890,548.09
		38,317,490.30	**34,890,548.09**

පාරිතෝෂික වගකීම් සඳහා වෙනම පවත්වාගෙන යන කාලීන තැන්පතු ආයෝජන මුදල රු.37,397,490.30 (2018-33,970,548.09)

8 **ආයෝජන -භාණ්ඩාගාර බිල්පත්**			
භාණ්ඩාගාර බිල්පත්		13,823,174.00	12,707,047.00
		13,823,174.00	**12,707,047.00**

පාරිතෝෂික වගකීම් සඳහා වෙනම පවත්වාගෙන යන කාලීන තැන්පතු ආයෝජන මුදල රු.13,823,174.00 (2018-12,707,047.00)

9 **මුදල් හා මුදල් සමාන දෑ**			
මුදල් -අතැති	සටහන **9.1**	2,811,789.83	634,775.00
මුදල් - බැංකු	සටහන **9.2**	563,528.37	601,517.21
කෙටිකාලීන තැන්පතු	සටහන **9.3**	528,919,572.41	452,766,101.70
මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් හා මුදල් සමාන දෑ		**532,294,890.61**	**454,002,393.91**
9.1 මුදල්- අතැති			
අතැති මුදල්		397,524.06	559,775.00
චෙක්පත්		2,339,265.77	
සුළු මුදල් අග්‍රිමය		75,000.00	75,000.00
		2,811,789.83	**634,775.00**

ජාතික ගමනාගමන කොමිෂන් සභාව *(ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2019	2018
9.2 මුදල් - බැංකු			
මහජන බැංකුව -නාරාහේන්පිට		496,518.37	545,472.43
			56,04
මහජන බැංකුව -නාරාහේන්පිට(ආසන වෙන් කිරීම්)		67,010.00	4.78
		563,528.37	**601,517.21**
9.3 කෙටි කාලීන තැන්පතු			
කෙටිකාලීන ආයෝජන සහ කැඳවුම් තැන්පතු		61,292,527.90	56,016,723.37
ආයෝජන- රෙපෝ		467,312,284.67	396,495,685.71
ඉතිරිකිරීමේ ගිණුම - ජාතික ඉතිරිකිරීමේ බැංකුව		314,759.84	253,692.62
		528,919,572.41	**452,766,101.70**

පාරිතෝෂික වගකීම් සඳහා වෙනම් පවත්වාගෙන යන ඉතිරිකිරීමේ ගිණුමේ තැන්පතු මුදල රු.314,759.84 (2018-253,692.62) .

10	**රජයේ ප්‍රදාන**		
	ජනවාරි 01දිනට ශේෂය	295,050,931.97	322,307,201.26
	වසර තුළ ප්‍රදාන ලැබීම්	-	-
	රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය	(27,229,632.11)	(27,256,269.29)
	දෙසැම්බර් 31ට ශේෂය	**267,821,299.86**	**295,050,931.97**

අංක.241 උද්‍යාන පාර, නාරාහේන්පිට පිහිටි ඉඩම ශ්‍රී ලංකා රජයෙන් ලද මූල්‍ය නොවන රජයේ ප්‍රදානයක් ලෙස හඳුනාගෙන ප්‍රදානය ලද අවස්ථාවේ වෙළඳපොල අගයට වත්කම් සටහන් කරගන්නා ලද අතර ගොඩනැගිලිවල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන ක්‍රමක්ෂය කරන ලදී.

11	**ගෙවියයුතු විශ්‍රාමික ප්‍රතිලාභ**		
	ජනවාරි 01 දිනට ශේෂය	40,817,143.00	37,088,716.75
	වසර තුළ හඳුනාගත් වියදම්	7,744,054.50	4,035,786.25
	වසර තුළ කරන ලද ගෙවීම්	(2,892,965.00)	(307,360.00)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**45,668,232.50**	**40,817,143.00**

12	**ගෙවිය යුතු**		
	කුලියට ගැනීම්	44,293.79	44,293.79
	මුද්දර ගාස්තු	15,500.00	15,275.00
	රක්ෂණ	379.00	-
	උපයන විට ගෙවීමේ බදු	23,218.000	50,400.00
	විවිධ ණයහිමියෝ	12,233,163.85	8,495,766.11
	ආදායම් කලට පෙර ලැබීම්	41,329,368.55	44,632,492.73
	වෙනත් ගෙවියයුතු	777,774.69	651,145.19
	EPF ගෙවිය යුතු	34,806.60	26,234.50
	ETF ගෙවිය යුතු	6,589.84	-
	බැංකු ණය සහ තැන්පතු	23,600.00	23,600.00
	ආසන වෙන් කිරීම සඳහා ගෙවියයුතු	40,600.00	29,634.78
	ලංසු රක්ෂණ ඉල්ලීම්	4,896,212.70	4,896,212.70
	කාර්යසාධන සුරක්ෂණ	2,438,700.00	2,438,700.00
	තිරසර පාසල් ව්‍යාපෘතිය	761,790.00	761,790.00
	BIA ගේට්වේ ව්‍යාපෘතිය	-	1,283,360.24
		62,625,997.02	**63,348,905.04**

13	**වෙන් කිරීම් සහ උපචිත වියදම්**			
	උපචිත වියදම් - ව්‍යාපෘති	**ඡ්‍යවහන 13.1**	24,240,960.37	19,297,412.27
	උපචිත වියදම් - පුනරාවර්තන	**ඡ්‍යවහන 13.2**	12,286,070.42	16,163,163.16
	විගණන ගාස්තු වෙන් කිරීම්		1,330,026.00	1,908,926.00
			37,857,056.79	**37,369,501.43**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව *(ශ්‍රී ලංකා රුපියල් වලින්)*

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	**2019**	**2018**
13.1 උපචිත වියදම් - ව්‍යාපෘති		
පුනරාවර්තන		
සමාජයීය සුභසාධන බස් සේවා සඳහා දායකත්වය	17,929,169.00	58,850.00
පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ	311,752.00	1,000.00
ගුණාත්මය හා ගාස්තු නියාමනය	2,102,005.33	10,673,106.54
ජාගකොස /පළාත් ප්‍රවාහන අධිකාරි ඇතුළු ප්‍රවාහනයට සෘජුව සම්බන්ධ ආයතනවල නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්	246,747.30	77,550.00
ප්‍රවාහනය ආශ්‍රිත පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්	120,978.08	2,800.00
ජාතික ප්‍රවාහන සංඛ්‍යා ලේඛණ වාර්තාව	1,433,997.00	-
තිරසර පාසල් ව්‍යාපෘතිය	-	4,100.00
BIA ගේට්වේ ව්‍යාපෘතිය	-	94,000.00
	22,144,648.71	**10,911,406.54**
ප්‍රාග්ධන		
පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ	2,033,815.22	6,313,740.32
ආයතනික ධාරිතාව නැංවීම සහ නියාමන ධාරිතාව සහතික වීමට නව ප්‍රතිසංස්කරණ සහ යටිතල පහසුකම් සංවර්ධනය	-	2,072,265.41
	2,033,815.22	**8,386,005.73**
	24,178,463.93	**19,297,412.27**
13.2 උපචිත වියදම් - පුනරාවර්තන		
පිරිසිදු කිරීමේ සේවා	1,236,932.58	1,102,566.64
සන්නිවේදන	257,121.59	262,086.58
විදුලිය සහ බලය	631,382.77	700,813.09
සේවක සුභසාධන	180.00	3,084,587.80
සේවක වෛද්‍යාධාර ක්‍රමය	7,500.00	15,000.00
EPF	58,011.00	39,351.75
ETF	6,961.32	7,870.35
ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්	6,609,489.26	6,382,299.97
ඉන්ධන සහ ලිහිසි	304,517.88	376,563.35
නිවාඩු දින දීමනා -විධායක	-	53,485.00
භාෂා දීමනා	-	78.00
නීති ගාස්තු	290,500.00	69,885.00
ගමන් වියදම් - දේශීය	39,257.50	46,550.00
මෝටර් රථ අළුත්වැඩියාව	254,811.74	
කාර්යාල උපකරණ නඩත්තු	34,347.49	6,126.74
ආන්තීය ආයතන සාමාජික ගාස්තු	12,500.00	8,500.00
රැස්වීම් සඳහා ආහාරපාන	3,690.00	100.00
පුවත්පත් සහ සඟරා	55,960.00	21,360.00
කාර්යාලයීය අවශ්‍යතා	145,554.00	81,940.00
විවිධ වියදම්	-	205,000.00
අනිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන	-	1,132,977.00
පුවත්පත් හා වාර සඟරා	-	207,000.00
මෝටර්රථ අළුත්වැඩියා සහ නඩත්තු	-	32,651.00
වැටුප් හා වේතන	208,664.00	235,910.50
ආරක්ෂක සේවා	1,513,350.00	1,454,608.48
කාර්ය මණ්ඩල පුහුණු	44,500.00	44,500.00
ප්‍රවාහන සහ කුලී ගාස්තු	496,800.00	536,728.00
ජලය	56,213.69	52,123.91
ලදුපත් මත මුද්දර ගාස්තු	17,825.00	2,500.00
	12,286,070.42	**16,163,163.16**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

(ශ්‍රී ලංකා රුපියල් වලිනි)

2019.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	2019	2018
14 ආදායම්		
14.1 බලපත්‍ර ආදායම්		
මාර්ග බලපත්‍ර ආදායම	440,000.00	262,132.96
බලපත්‍ර අළුත්කිරීමේ ආදායම	21,432,500.00	21,344,886.00
මාර්ග ටෙන්ඩර් ආදායම	307,815,617.95	317,046,545.29
	329,688,117.95	**338,653,564.25**
14.2 වෙනත් ආදායම්		
පරිපාලන ආදායම්	35,316,397.24	39,012,160.00
බැස්ටියන් මාවත වැසිකිලි ආදායම	10,948,173.77	8,618,860.25
විවිධ ආදායම්	37,011,962.75	32,394,774.60
	83,276,533.76	**80,025,794.85**
මුළු ආදායම	**412,964651.71**	**418,679,359.10**
15 වෙනත් ආදායම්		
15.1 පොළී ආදායම්		
තැන්පතු මත පොළිය	4,742,207.98	38,732,131.85
ආපදාණය පොළිය	941,158.00	1,003,040.00
	41,683,365.98	**39,735,171.85**
15.2 වෙනත්		
රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය	27,229,632.11	27,256,269.29
	27,229,632.11	**27,256,269.29**
	68,912,998.09	**66,991,441.14**
16 මෙහෙයුම් වියදම්		
16.1 සේවක මණ්ඩල වියදම්		
වැටුප් හා වේතන	81,424,350.52	78,469,325.88
ජීවන වියදම් දීමනාව	17,671,544.00	18,090,840.00
වෘතීය දීමනා	655,807.00	749,023.00
භාෂා දීමනාව	291,742.60	258,347.72
සේවක අර්ථසාධක අරමුදල්	14,844,058.05	13,502,125.28
සේවක භාරකාර අරමුදල	2,975,772.93	2,700,425.05
නිවාඩු දින දීමනා -විධායක	1,222,846.00	568,745.00
අතිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන	14,814,377.00	10,959,065.78
පාවිච්චියට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්	6,824,177.26	6,418,459.97
පාරිතෝෂික	7,744,054.50	4,035,786.25
ප්‍රසාද දීමනා	2,754,658.00	2,754,250.00
	151,223,387.86	**138,506,393.93**
16.2 ප්‍රවාහන		
මෝටර්රථ අළුත්වැඩියා සහ නඩත්තු	4,126,839.61	5,761,137.22
ඉන්ධන සහ ලිහිසි	4,671,814.14	4,748,096.52
ප්‍රවාහන සහ කුලී ගාස්තු	7,782,647.50	7,638,169.04
බලපත්‍ර සහ රක්ෂණ	1,105,002.39	1,335,172.00
	17,686,303.64	**19,482,574.78**
16.3 ගමන් වියදම් හා යැපීම් දීමනා		
විදේශ ගමන් වියදම්	7,400.00	931,524.00
දේශීය ගමන් වියදම්	3,784,047.98	3,495,475.95
	3,791,447.98	**4,426,999.95**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

(ශ්‍රී ලංකා රුපියල් වලින්)

2019.12.31 දිනෙන් අවසන් වර්ෂයේමූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	**2019**	**2018**
16.4 සේවා ස්ථාන වියදම්		
කාර්යාලයීය අවශ්‍යතා (ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ)	5,865,410.29	4,865,093.51
පිරිසිදු කිරීම්	12,933,169.21	10,491,432.71
වරිපනම් හා බදු	288,288.00	288,288.00
ආරක්ෂක සේවා	15,463,832.47	17,968,132.22
විදුලිය සහ බලය	9,413,417.16	8,546,462.23
ජලය	610,202.72	658,553.34
අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු	817,000.00	840,400.00
රැස්වීම් සඳහා ආහාරපාන	361,163.20	437,157.42
මාර්ගස්ථ මුදල් රක්ෂණය	51,874.76	60,638.20
සන්නිවේදන	3,619,521.87	3,404,388.21
	49,423,879.68	**47,560,545.84**
16.5 ස්ථාවර වත්කම් අළුත්වැඩියා සහ නඩත්තු		
ගොඩනැගිලි අළුත්වැඩියාව	821,293.37	684,349.33
කාර්යාලයීය උපකරණ අළුත්වැඩියාව	2,084,300.00	1,341,979.27
පරිගණක සහ උපාංග අළුත්වැඩියාව	82,136.45	129,738.69
	2,987,729.82	**2,156,067.29**
16.6 සේවක සුභසාධනය		
සේවක වෛද්‍යාධාර ක්‍රමය	289,800.00	950,275.00
සේවක සුභසාධනය	11,054,890.63	7,895,204.13
නිල ඇඳුම්	864,732.00	913,799.80
	12,209,422.63	**9,759,278.93**
16.7 සේවක සංවර්ධනය		
සේවක පුහුණු කිරීම්	971,594.00	2,525,546.73
වෘත්තීය ආයතන සාමාජික ගාස්තු	176,432.35	238,802.84
	1,148,026.35	**2,764,349.57**
16.8 නීති ගාස්තු සහ වෙනත්		
විගණන ගාස්තු	601,000.00	650,000.00
නීති ගාස්තු	2,088,811.00	800,647.50
	1,450,647.50	**1,450,647.50**
16.9 තොරතුරු		
පුවත්පත් දැන්වීම්	966,948.75	2,426,384.75
පුවත්පත් සහ සඟරා	152,060.00	196,157.50
	1,119,008.75	**2,622,542.25**
16.10		
ක්ෂය		
ගොඩනැගිලි	9,626,782.71	8,706,309.91
මෝටර් වාහන	2,250,000.00	2,250,000.00
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	3,037,376.03	3,070,259.17
කාර්යාලයීය උපකරණ	2,883,035.44	696,602.46
විවිධ උපකරණ	1,316,217.72	619,628.78
පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර	6,315,979.42	5,776,598.09
යන්ත්‍රෝපකරණ	460.00	2,990.00
	25,429,851.72	**21,122,388.41**
16.11 මූල්‍ය ගාස්තු		
බැංකු ගාස්තු	51,186.52	47,178.38
	51,186.52	**47,178.38**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව *(ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

2019.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	**2019**	**2018**
16.12 වෙනත් වියදම්		
විවිධ වියදම්	383,251.50	536,382.50
ලදුපත් සඳහා මුද්දර ගාස්තු	63,900.00	47,375.00
	447,151.50	**583,757.50**
17 මෙහෙයුම් නොවන ආදායම්		
අපහරණය කළ වත්කම්	40,175.00	129,240.00
	40,175.00	129,240.00
18 ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන		
ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන- පුනරාවර්තන	581,750,000.00	400,000,000.00
ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන- ප්‍රාග්ධන		-
	581,750,000.00	**400,000,000.00**
19 19.1 රජයේ ප්‍රදාන මත විශේෂ ව්‍යාපෘති වියදම්		
ව්‍යාපෘති වියදම් -පුනරාවර්තන	581,750,000.00	400,000,000.00
ව්‍යාපෘති වියදම් -ප්‍රාග්ධන	-	400,000,000.00
	581,750,000.00	400,000,000.00
19.2 ජාගකොස අරමුදල් මත විශේෂ ව්‍යාපෘති වියදම්		
ව්‍යාපෘති වියදම් -පුනරාවර්තන	26,950,120.15	29,992,053.00
ව්‍යාපෘති වියදම් -ප්‍රාග්ධන	8,342,150.81	39,954,199.92
	35,292,270.96	**69,946,252.92**

2018.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ශ්‍රී ලංකා රාජ්‍ය ගිනුම්කරණ ප්‍රමිත අංක 3 අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු හා වැරදීම් සඳහා කරන ලද ගැලපීම් පහත පරිදි වේ.

1. කෙරීගෙන යන වැඩ ගිණුම රු. 1,428,545.00 හා විවිධ ණය හිමියෝ රු. 357.134.00 බැර කිරීම මගින් පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ගිණුම රු.1,785,679.00 හර කිරීම.

2. රු.1,785,679.00 ක පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර පිරිවැයට අදාල රු.79,499.40ක ක්ෂය අගය ශ්‍රී ලංකා රාජ්‍ය ගිනුම්කරණ ප්‍රමිත අංක 7 අනුව හඳුනා ගැනීම .

2018 මූල්‍ය ප්‍රකාශන වලට අදාලව ඉහත කරන ලද ගැලපීම් මත 2018 වර්ෂයේ ශුද්ධ අතිරික්තය / ඌනතාවය රු.165,284,562.39 සිට රු.165,205,062.99 දක්වා පහළ යන ලදී.
මෙම ගැලපීම් වල ප්‍රතිඵලයක් ලෙස සමුච්චිත අතිරික්තය / ඌණතාවය රු.484,300,036.11 සිට රු.484,220,536.71 දක්වා පහළ යන ලදී.

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිවිපිඒ/එන්ටීසී/එෆ්ඒ/01/2019/12 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 නොවැම්බර් 23 දින

සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) කොමිෂන් සභාව විසින් ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා දරණු ලද රු.4,834,504ක් අයහාර වියදමක් ලෙස නොසලකා ප්‍රාග්ධන ගත කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය සහ වත්කම් වලට අදාල අනුරූප ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.4,592,779ක් හා රු.241,725ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

(ආ) කිලිනොච්චි බස් නැවතුම්පල ඉදිකිරීම සම්බන්ධයෙන් වූ ගිවිසුම උල්ලංඝනය වීම නිසා කොමිෂන් සභාව විසින් රු.4,869,212 ක් වූ ලංසු සුරක්ෂණය හා රු.2,438,700ක් වූ කාර්යසාධන සුරක්ෂණය අයකර ගැනීමට කටයුතු කලද එම මුදල ආදායමට බැර නොකර ගෙවිය යුතු ගිණුම් යටතේ ඉකුත් වර්ෂයේ සිට දක්වා තිබුණි. ඒ අනුව මුල්‍ය ප්‍රකාශන වල සමුච්චිත අතිරික්තය රු.7,334,912 ක් අඩුවෙන් හා ගෙවිය යුතු ශේෂය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් 2019 දෙසැම්බර් 31 දිනට ගිණුම් වල ගලපා තිබුණු මුළු වටිනාකම රු.40,698,427 ක් වූ වත්කම් වගකීම්,ආදායම් හා වියදම් වලට අදාල ජනල් වවුචර් පත් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු රු.59,703,404 කට අදාල ටෙන්ඩර් තැන්පතු ලේඛනයද විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම අයිතම සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඈ) සිසු සැරිය , ගැමිසැරිය හා නිසි සැරිය ව්‍යාපෘතිය යටතේ සේවා සපයන ලද ආයතන වෙත 2019 දෙසැම්බර් 31 වන දිනට ගෙවිය යුතු රු.30,205,433ක වගකීම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන් කිරීම් සිදුකර නොතිබුණි. එසේම මෙකී සේවාවන් සැපයීම වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්තියක් මත මහා භාණ්ඩාගාරයෙන් අදාල පිරිවැය ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා ප්‍රදානයන් ලබාදී තිබුණද, එම ප්‍රදානයන් ගිණුම් තැබීම සම්බන්ධ ගිණුම් ප්‍රතිපතියක් කොමිෂන් සභාව විසින් හඳුනාගෙන නොතිබුණි.

(ඉ) අන්තර්ජාලය හරහා මගී ආසන වෙන් කිරීම් ව්‍යාපෘතියේ වැඩ නිමකර කොමිෂන් සභාව වෙත 2018 ඔක්තෝබර් 27 දින භාරදී තිබුණු අතර, පිරිවැය රු. 1,750,000 ක් වූ මෙම ව්‍යාපෘතියේ ඉකුත් වර්ෂයේදී නිම කල වැඩ වටිනාකම වූ රු. 1,428,545 ක් පරිගණක සම්බන්ධිත මෘදුකාංග ගිණුමට ප්‍රාග්ධනිත කල යුතු වුවත්, එය කෙරීගෙන යන වැඩ ගිණුමට හර කර තිබුණු අතර, එය සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි නොකිරීම නිසා පරිගණක සම්බන්ධ මෘදුකාංග ගිණුම එම අගයෙන් අඩුවෙන්ද, කෙරීගෙන යන වැඩ ගිණුම එම අගයෙන් වැඩියෙන්ද, මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රීලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

* වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදි අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

* අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

* භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

* සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ ආදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා

නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

* හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය, ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

02. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහා අවභ්‍යතාවන් අනුව,මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කුරණු වලින් වන ලබපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපවේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්ථාවේ 1.2 (ආ) හා (ඉ) ඡේදවල දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) අංක. පි.ඊ.ඩි 12 සහ 2003 ජූනි 02 දිනැති ව්‍යාපාර චක්‍රලේඛයේ 9.1.2 වගන්තිය	ආයතන සුභ සාධන යෝජනා ක්‍රම සම්බන්ධයෙන් භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සේවක රක්ෂණ හා අනෙකුත් සුභසාධන කටයුතු සඳහා රු12,209,422 ක් වැයකර තිබුණි.
(ආ) අංක පී.ඊ.ඩි.2/2015 හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 4 වන වගන්තිය	මෙම චක්‍රලේඛයට පටහැනිව ජංගම දුරකතනයක් හා (Apple 11.0 I pad) අයි පෑඩ් එකක් මිලදී ගැනීම සඳහා අවස්ථා දෙකකදී රු136,500 ක් හා රු.223,999 ක් වැය කර තිබුණි.
(ඇ) අංක 2016/30 හා 2019 දෙසැම්බර් 29 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	චක්‍රලේඛය පරිදි වාහනය ගැලවූ ගරාජයෙන් ලබා ගන්නා මිල ගණන් වල සාධාරණත්වය පිළිබඳව රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ මණ්ඩලයක සුදුසුකම් ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ සහතිකයක් ලබාගත යුතු වුවත්, කොමිෂන් සභාව එසේ සහතිකයක් ලබාගැනීමෙන් තොරව වාහනයක් අළුත්වැඩියා කිරීම සඳහා රු.167,847 ක් වැය කර තිබුණි.
(ඈ) 1971 අංක 38 දරන මුදල් පනතේ 10 (5) වගන්තිය	කොමිෂන් සභාවේ සෑම වර්ෂයක් අවසානයේදීම ඇති වන ශුද්ධ අතිරික්ත ආදායමෙන් ඉතිරි සියළුම මුදල් ඒකාබද්ධ අරමුදල වෙත බැර කළ යුතු වුවද, 2019 වර්ෂයේ රු.178,379,348 ක අතිරික්තයක් තිබුණද, රු.50,000,000 ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණි.
(ඉ) මුදල් පනතේ 11 වෙනි වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පිඊඩි/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය	අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේ දී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සහ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ආයතනය විසින් රු.37,397,490 ස්ථාවර තැන්පතු හා රු.13,823,174 භාණ්ඩාගාර බිල්පත්හි සමාලෝචන වර්ෂයේදී ආයෝජනය කර තිබුණි. තවද 2019 දෙසැම්බර් 31 දිනට රු.528,949,572 ක් කෙටි කාලීන අයෝජනවල ද යොදවා තිබුණි.
(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i) මුදල් රෙගුලාසි 371 (2) (ආ)	විශේෂ කාර්යන් සඳහා අත්තිකාරම් ලබාදීමේදී මාණ්ඩලික තත්වයේ නිලධාරීන්ට පමණක් අත්තිකාරම් ලබාදිය යුතු වුවද, ඉන් පරිබාහිර වෙනත් නිලධාරීන්ටද අත්තිකාරම් ලබාදී තිබුණු බව නිරීක්ෂණය වූ අතරම තත්කාර්ය අතුරු

අග්‍රිම ලබාදීම එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයකට සීමා විය යුතු වුවද, එම සීමාව ඉක්මවමින් 2019 වර්ෂය තුල අවස්ථා 22 කදී, එකතුව රු.4,827,137ක අත්තිකාරම් ලබාදී තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 (5) යම් අතුරු අග්‍රිමයක් ලබාදී අදාල කාර්ය නිමවී දින 10 ක් ඇතුලත එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද, අවස්ථා 10 කදී රු.737,675 ක අත්තිකාරම් පියවීම් මෙම රෙගුලාසි වලට පටහැනිව සිදු කර තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

03. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) කිලිනොච්චි බස් නැවතුම්පොල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මාස 12 කොන්ත්‍රාත් කාල සීමාවක් තුල රු.48,773,045 ක පිරිවැයකට ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණු නමුත් කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචිය ගිවිසුම්ගත දිනය වූ 2016 දෙසැම්බර් 29 දිනට කල් ඉකුත් වී තිබුණි. එසේම මෙම කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු පැහැර හැර තිබුණද 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 සහ 5 වගන්ති ප්‍රකාරව පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට එම කොන්ත්‍රාත්කරුගේ නම ඇතුලත් කිරීමට කටයුතුකර නොතිබුණු අතර නිම කරන ලද වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.16,469,363ක් ගෙවීම් ද කර තිබුණි. මේ හේතුවෙන් නියමිත ලෙස අදාල වැඩ නිම නොකිරීම නිසා මහජනතාවට බස් නැවතුම පරිහරණය කිරීමට තිබූ අවස්ථාව මගහැරී ඇති අතර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ ඉහත සඳහන් මුදල අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.එසේම මෙම ඉදිකිරීම උතුරු පළාත් සභාවට තවදුරටත් ඉදිකිරීම් කිරීම සඳහා භාරදීමට සැලසුම් කළද, 2020 ජුනි 30 තෙක් උතුරු පළාත් සභාව විසින් භාරගෙන නොතිබුණි.

(ආ) කොමිෂන් සභාව පෞද්ගලික ආයතනයක් සමග 2017 දෙසැම්බර් 31 දින Process Automation System (PAS) ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා රු.31,735,051 ක් වටිනාකමකට ගිවිසුමකට එළඹව තිබූ අතර, අදාල ව්‍යාපෘතිය 2018 නොවැම්බර් 15 දින වනවිට නිමකිරීමට නියමිතව තිබුණි. එසේ වුවත් 2019 දෙසැම්බර් 31 දින වන විටද ව්‍යාපෘතිය නිමකර නොතිබුණු අතර අදාල ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය 2019 දෙසැම්බර් 31 දින වන විට විගණනයට ඉදිරිපත් නොකෙරුණු නමුත් අදාල කොන්ත්‍රාත්කරු වෙත රු.23,056,820 ක් ගෙවා තිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 31 දිනට කොමිෂමේ අනුමත කාර්ය මණ්ඩලය 219 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 199 ක්වී තිබුණි. එම කාර්ය මණ්ඩලයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 කද, තෘතීය මට්ටමේ තනතුරු 01 ක්ද ද්විතිය මට්ටමේ තනතුරු 01 ක්ද හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 13 ක්ද පුරප්පාඩු පැවතියද, අදාල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) කොමිෂන් සභාව විසින් අන්තර් පළාත් බස් රථ වල සේවය කරන රියදුරු හා කොන්දොස්තර මහතුන් සඳහා නිල ඇඳුම් ලබාදීම සඳහා 2014 වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු සිදු කර පෞද්ගලික ආයතනයකින් නිල ඇඳුම් 15,000 ක් රු.8,372,619 ක මිලකට මිලදී ගැනීම් සිදු කර තිබුණි. මෙම නිල ඇඳුම් වලින් රු.887,893 ක් වටිනා කමිස 1801 ක් විගණිත දිනය වන 2020 ජූලි 07 වන දිනටත් ලේඛනාගාරයේ ගොඩගසා ඇති බව නිරීක්ෂණය වූ අතර ඉතිරි කමිස බෙදා දුන් බවට තහවුරුවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 24 වන වගන්ති අනුව මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීමට සහ අවසර පත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවට බලතල ලබාදී තිබුණු අතර 2005 ඔක්තෝබර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ටෙන්ඩර් කැඳවීම් සිදුකර නිත්‍ය මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබාදී තිබුණද කොමිෂන් සභාව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නියමිත ක්‍රමවේදයන් හඳුන්වා දී නොතිබුණි . එසේම වුවත් ටෙන්ඩර් කැඳවීම මගින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම පිළිබඳව ඇතුලත් කර පනත සංශෝධනය කිරීමට ද කොමිෂන් සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඊ) පනත සංශෝධනය කිරීමෙන් තොරව කොමිෂන් සභාව විසින් 2019 දෙසැම්බර් 31 දින වන විට මගී සේවා අවසර පත්‍ර 3103 ක් නිකුත් කර තිබුණු අතර ඉන් අවසර පත්‍ර 223 ක් ටෙන්ඩර් කැඳවීම් කර නිකුත් කර තිබුණි. බලපත්‍ර 2880 ක් ටෙන්ඩර් කැඳවීම් ක්‍රමවේදයට පෙර නිකුත් කර ඇති බලපත්‍ර වන අතර ඒවා වාර්ෂිකව රු.3,000ක හා රු.15,000 ක ගෙවීමක් මත අළුත් කළයුතු බලපත්‍ර විය. මේ අනුව කොමිෂන් සභාව අනුමත ක්‍රියාපරිපාටියකින් තොරව බලපත්‍ර නිකුත් කිරීම විවිධ ක්‍රම යටතේ සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම අධිවේගී මාර්ගයේ දිනකට අවම තාක්ෂණික අගය මත මගී සේවා අවසර පත්‍ර 61 ක්ද රු.2500 ගාස්තු මත මගී සේවා අවසර පත්‍ර 16 ක්ද නිකුත් කර තිබුණි.

(උ) 2019 වර්ෂයේදී මගී සමීක්ෂණ සිදු කිරීම මගින් නව මාර්ග හඳුනාගැනීම් සිදු කර තිබුණද කොමිෂන් සභාව විසින් නිත්‍ය මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද විශාල මගී ඉල්ලුම් සහිත අවස්ථා වලදී දිනකට රු.200 , රු.1000 හා රු1500 යන දෛනික ගාස්තු අයකිරීම මත තාවකාලික මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කර තිබුණි.

(ඌ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනයේ වත්කම් මිළදී ගැනීම් පමණක් සටහන් කරන අතර එම ලේඛනයේ වත්කම් ඉවත් කිරීම් පිළිබඳ තොරතුරු ඇතුලත් කර නොතිබුණු අතර වර්ෂය තුලදී මිළදී ගෙන ඇති මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති රු.4,507,651 ක් වූ වත්කම් අයිතම 45 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. එමෙන්ම වත්කම් ලේඛනයේ සටහන් තැබීමේදී වත්කම් සඳහා හඳුනාගැනීමේ අංකගත ක්‍රමයක් සඳහන් කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය වූ අතර, සමාලෝචිත වර්ෂය තුලදී රු.1,248,178 ක්

වටිනාකමින් යුත් වත්කම් අපහරණය කර තිබුණ ද, ස්ථාවර වත්කම් ලේඛනයක් නොමැති වීම හේතුවෙන් එම වත්කම් වල වටිනාකම හා ක්ෂය වෙන්කිරීම් පිලිබඳ තොරතුරු විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන රු.1,269,973 ක් වටිනා පුස්තකාල පොත් ලේඛනයක සටහන් කර ද නොතිබුණි.

(එ) කොමිෂන් සභාව විසින් සභා කාර්යාල අසල සහ බැස්ටියන් මාවත පොලිස් මුරපොල අසල පිහිටි වැසිකිලි පද්ධති 02 පොදු පහසුකම් සපුරාදීම සඳහා නඩත්තු කිරීම පිණිස පුද්ගලික ආයතනයක් සමග 2010 සැප්තැම්බර් 18 දින සිට 2020 සැප්තැම්බර් 17 දක්වා වසර 10 ක කාලයක් සඳහා ගිවිසුම්ගත වී තිබුණි. මෙහිදී මෙම ගිවිසුමෙහි 1,2,7 හා 8 වන කොන්දේසි කඩකිරීම පිළිබඳව දිගින් දිගටම කොමිෂම වෙත මහජන පැමිණිලි ලැබී තිබුණු අතර, ඒ අනුව 2015,2016,2017 හා 2019 වර්ෂවල අවවාදාත්මක ලිපි යවා තිබුණද එම ආයතනය විසින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මෙහිදී ආයතනය කොන්දේසි කඩකර තිබුණද විගණිත දිනය වන 2020 ජනවාරි 30 දින වන විටත් ඒවා විධිමත් කිරීමට අදාල පියවර ගෙන නොතිබුණු අතර කොමිෂන් සභාව විසින්ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ද නොතිබුණි. එසේම බැස්ටියන් මාවත බස් පර්යන්තයේ ආබාධිත අය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට රු.මිලියන 2 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එහි සියයට 50 ක භෞතික ප්‍රගතියක් පමණක් ඇති බව ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය.

(ඒ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව බස් රථ ගාස්තු සඳහා පෙර ගෙවුම් කාඩ් ක්‍රමයක් හඳුන්වාදීමට සැලසුම් කර තිබුණද එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ඔ) කොමිෂන් සභාව විසින් නිසි සැරිය ව්‍යාපෘතිය සඳහා නව බස් රථ සේවා 50 ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද නව බස් රථ සේවා 6 ක් පමණක් ආරම්භ කිරීමට හැකිවී තිබුණි. මෙහි භෞතික ප්‍රගතිය සියයට 12 ක පමණක් පෙන්නුම් කර තිබුණු අතර ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් රු.මිලියන 2.6 ක් ඉතිරි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) මෙම වියදමෙහි අගය ප්‍රමාණාත්මක අගයක් ගන්නා බැවින්ද එමගින් වත්කමේ අගය වැඩිවීමක් සිදුව ඇති බැවින්ද එම අගය ප්‍රාග්ධනිත කරන ලදී.

(ආ) මෙම වසරේදී කිලිනොච්චි බස් නැවතුම්පල උතුරු පළාත් සභාවට භාර දීමට කටයුතු කරන අතර, මූල්‍ය ප්‍රකාශන වල ගැටළුවද ඉන් පසුව නිරාකරණය වේ.

(ඇ) හැකි සෑම අවස්ථාවකම උපලේඛණ ජනලයට අමුණා ඇති අතර ඇමිණීමට නොහැකි සවිස්ථරාත්මක උපලේඛණ වෙනම ලිපිගොනුවල පවත්වාගෙන යනු ලබන අතර එම ලේඛන විගනණය වෙත ඉදිරිපත් කරන ලදි. කෙසේ වෙතත් හැකි සෑම අවස්ථාවකම උපලේඛණ ජනලයට ඇතුලත් කිරීමට සටහන් කරගන්නා ලදි.

(ඈ) සිසු සැරිය, ගැමි සැරිය, නිසි සැරිය ව්‍යාපෘති සඳහා 2019 දෙසැම්බර් 31 දිනට ගෙවා ඇති මුදල හා වර්ෂයට අදාළ භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ප්‍රතිපාදන අතර වෙනස සඳහා ණයහිමි ප්‍රතිපාදන වෙන්කර ඇති අතර, අතිරික්ත මුදල පසු වර්ෂයේ වියදම් ලෙස දක්වා ඇත. එයට හේතුව වර්ෂයට අදාළ වියදම් දැරීම සඳහා ප්‍රමාණවත් භාණ්ඩාගාර ප්‍රතිපාදන නිදහස් නොකිරීම වේ.

(ඉ) අන්තර්ජාල හරහා මගී ආසන වෙන් කිරීමේ ව්‍යාපෘතියට අදාල අගය වන රු.1,428,545 ක මුදලට අදාල නිවැරදි කිරීමේ ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල ගලපා ඇත.

02 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

නීති රීති/විධානයට යොමුව

(අ) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අංක 9 (ඉ) යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට පවරා ඇති බලතල අනුව කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවකයන් සඳහා සුභ සාධක විනෝදාංශ පහසුකම් සැපයීම කොමිෂන් සභා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

(ආ) ආයතනයෙන් පිටත සිටියදී සභාපතිතුමාට ලැබෙන මගී පැමිණිලි සම්බන්ධයෙන් Online මාර්ගයෙන් විමසුම් කිරීමට ආයතනයේ GPS පාලන මැදිරිය හා සම්බන්ධ වීමට සිදුවේ. ඒ වෙනුවෙන්, ඒ සඳහා විශේෂ පහසුකම් සහිත ජංගම දුරකථනයක් ලබා දී ඇත.

ආයතනයේ ERP පද්ධතියෙන් අනුමැතිය ලබාදීමට I Pad ය උපයෝගී කරගන්නා අතර, එමගින් සභාපතිතුමාට ආයතනයේ CCTV පද්ධතිය හා සම්බන්ධ වීමට හැකිය. එය රාජකාරී අවශ්‍යතාවය සලකා ලබා දී ඇත.

(ඇ) 2019 සැප්තැම්බර් මස 24 වන දින රාජකාරී කටයුත්තකට යෑමේදී බැද්දගාන ප්‍රදේශයේදී එන්ජිමට ජලය කාන්දුවීම හේතුවෙන් අනතුරට ලක් වූ KY – 9256 අංක දරන මෝටර් රථය පණගැන්වීමට නොහැකි තත්ත්වයක තිබූ බැවින්, එම අවස්ථාවේදී රියදුරු විසින් හදිසි පරීක්ෂාව සඳහා ඒජන්තවරුන් ගෙන්වා ගැනීමට උත්සහකර ඇත. එහෙත් ඒ සඳහා දීර්ඝ වේලාවක් ගතවීම හා කාර්මික ශිල්පීන් ගෙන්වා ගැනීම අපහසු තත්ත්වයක පැවතීම හේතුවෙන් අනතුරට සිදු වූ ස්ථානයට සමීපව පිහිටි, ප්‍රවාහන අමාත්‍යාංශයේ ලියා පදිංචි ගරාජයක් වන, ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතු වාහන අලුත් වැඩියා කරනු ලබන සංජීව මෝටර්ස් ආයතනය දැනුවත් කර ක්ෂණිකව ඔවුන්ගේ කාර්මික ශිල්පීන්ගේ පරීක්ෂාවට ලක් කර ඇත. ශ්‍රී ලංගම කාර්මික ඉංජිනේරු විසින් මෙම මෝටර් රථය පරීක්ෂාවට ලක් කිරීමට දුරකථනයෙන් දැනුම් දී තිබුණද, අධික වර්ෂාව හා ගංවතුර හේතුවෙන් ඉංජිනේරු මහතාට ක්ෂණිකව සහභාගි වීමට නොහැකි වී ඇත. KY – 9256 අංක දරන මෝටර් රථය සභාපති තුමාගේ නිලරථය බැවින් එම වාහනය ඉතා ඉක්මනින් අළුත්වැඩියා කටයුතු අවසන් කල යුතුව තිබූ බැවින්, සභාපති තුමාගේ උපදෙස් මත සංජීව මෝටර්ස් ආයතනය මගින් අලුත්වැඩියා කටයුතු සිදුකරන ලදී. අලුත් වැඩියා කටයුතු කරමින් පවතින අවස්ථාවේදී, ශ්‍රී ලංගම කාර්මික ඉංජිනේරු විසින් මෙම මෝටර් රථය පරීක්ෂාවට ලක් කොට ඇති අතර, අලුත් වැඩියාවෙන් අනතරුව ද අලුත්වැඩියාවන් කටයුතු සාර්ථකව සිදු කර ඇති බවට නිර්දේශ කර ඇත.

(ඈ) අත්‍යාවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගත හැකි පරිදි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන ඉතිරි කර ගනිමින් උපරිම අරමුදල් ප්‍රමාණයක් භාණ්ඩාගාරය වෙත යැවීමට සටහන් කර ගන්නා ලදී.

(ඉ) තාවකාලික අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය මඟින් ඉල්ලීම් කර ඇත. (අදාල ලිපියේ පිටපත විගණකාධිපතිගේ අංක ආර්ටි/බී/එන්ටීසී/එෆ්ඒ/2012/22 දරන විමසුමට පිළිතුරු සමඟ විගණනය වෙත ඉදිරිපත් කර ඇත) එසේ වුවත් 2012 අගෝස්තු මස 22 වන දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභාවේදී, කෙටි කාලීන අතිරික්ත අරමුදල් සත් දින කැඳවුම් තැන්පතු වන ආයෝජනය කරනවා වෙනුවට යම් කොටසක් වැඩි පොළී ආදායමක් ලැබීම සඳහා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරන මෙන් උපදෙස් ලැබී ඇත.

(රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභා රැස්වීම් සටහන් වල පිටපතක් අංක ආර්ටි/බී/එන්ටීසී/එෆ්ඒ/2012/22 දරන විමසුමට පිළිතුරු සමඟ විගණනය වෙත ඉදිරිපත් කර ඇත.)

එයට අමතරව තාවකාලික අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ප්‍රවාහන සේවා කළමණාකරන අමාත්‍යාංශය වෙත 2019.02.07 දිනැතිව ඉල්ලීමක් කර ඇති අතර මේ දක්වා එයට පිළිතුරක් ලැබී නොමැති බවද කාරුණිකව දන්වා සිටිමි.

(ඊ) **(i)** ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ගිණුම්කරන ප්‍රතිපත්තිය අනුව අත්තිකාරම් මුදල් නිදහස් කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම විවිධ ව්‍යාපෘති සඳහා දුර බැහැර ප්‍රදේශවලට යාමේදී අදාල නිලධාරීන් වෙත අත්තිකාරම් ලබා දීමට සිදු වන බවත් බොහෝ අවස්ථාවලදී වෙක්පත් මඟින් ගෙවීම් කිරීමත් සිදු කරනු ලබයි.

(ii) දින 03 ක් ඇතුලත අත්තිකාරම් පියවීම සිදුකරන ලබන අතර නොවැලැක්විය හේතුමත දින කිහිපයක් ප්‍රමාද උවත් එවැනි අවස්ථාවලදී අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියක් සහිතව පියවීම සිදුකරනු ලබන අතර විගනණ විමසුමේ පෙන්වා ඇති පරිදි ඉදිරියෙදි මෙවැනි ප්‍රමාද වීම් සිදු නොවීමට සටහන් කරගන්නා ලදි.

03 අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) උපදේශක ආයතනය මඟින් ලබා දී ඇති වාර්තාව අනුව තෝරාගන්නා ලද ලංසුකරු අවම මිලගණන් ඉදිරිපත් කර ඇති අතර ICTAD ලියාපදිංචිය C3 වේ. එය 2017 -06-06 දින දක්වා දික් කර ඇති බව සඳහන්ය.

තවද තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේදී ඒ ආකාරයෙන් සඳහන්ව ඇත.
කාලය දික්කරන ලද බවට තහවුරු කරන ICTAD වාර්තා පොතෙහි අදාළ පිටුවේ පිටපත විගණනය වෙත ඉදිරිපත් කර ඇත.

ධර්මදාස කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් එන්ටර්ප්‍රයිසස් ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ අසනීපව අසාධ්‍ය තත්ත්වයේ සිටින බව දන්වා කිලිනොච්චි බස් නැවතුම්පලේ ඉතිරි වැඩ කටයුතු සිදු කිරීමට නොහැකි බව ලිඛිතව දන්වා ඇත.

ගිවිසුම අවසන් කිරීමේදී එදිනට පැවති අත්තිකාරම් බැඳුම්කරය වන රු.4,896,212.70 ක් අදාල බැංකුවෙන් අයකර ගන්නා ලදි. ඒ අනුව ගෙවන ලද මුදල වනුයේ (16,469,363.48 – 4,896,212.70) රු.11,573,150.78 කි.

කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම අවසන් වීමේදී කර ඇති වැඩ ප්‍රමාණය රු. 15,397,989.93 ක් ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් සහතික කර ඇත. නමුත් ඉහත දක්වා ඇති පරිදි ගෙවා ඇති මුදල රු. 11,573,150.78 කි. තවද කාර්ය සාධන සුරක්ෂණයට අදාල රු.2,438,700.00 ක්ද, ප්‍රමාද ගාස්තු ලෙස රු.2,438,625.25 ක්ද, ජාගකොස විසින් අය කර ඇති බැවින් රු.15,397,989.93 ක කාර්යය සඳහා ජාගකොස වැය කර ඇත්තේ රු. 9,134,450.78 කි. (11,573,150.78 - 2,438,700.00). ඒ අනුව මූල්‍ය අලාභයක් ආයතනයට සිදු වී නොමැති බව කාරුණිකව සඳහන් කරමි.

කොන්ත්‍රාත් ගිවිසුම අනුව අදාල ක්‍රියාමාර්ග නිසි පරිදි ගැනීම නිසා අත්තිකාරම් සුරක්ෂණය, කාර්යය සාධන සුරක්ෂණය සහ ප්‍රමාද ගාස්තුද අය කර ගැනීම හැකියාව පැවතින.

අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන්ට අනුව කිලිනොච්චි බස් නැවතුම්පල උතුරු පළාත් සභාවට භාර දීමට අදාල සියළු ලියකියවිලි, කමිටු වාර්තා, භාරදීමේ ලිපිය ජාගකොස පාර්ශවයෙන් අත්සන් තබා ඉදිරි කටයුතු සඳහා උතුරු පළාත් සභාව වෙත යොමු කර ඇත.

(ආ) මෙම ව්‍යාපෘතිය අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වූ අතර, මෙම අදියර තුනේම මෘදුකාංග සංවර්ධන කටයුතු මේ වන විට අවසන්ව ඇත. ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා ඉතා සංකීර්ණ ක්‍රියාවලීන් ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතිය තුළ සිදුකිරීමට වීම, ICTA ආයතනයෙන් Cloud පහසුකම් ලබාගැනීමට වූ ප්‍රමාදය, ආයතනය තුළ පවතින ලිපිගොනු 3200ක් ස්කෑන් කර මෘදුකාංගය තුලට ඇතුළත් කිරීම සඳහා කාලයක් ගත වීම, එක් එක් ක්‍රියාවලීන් සඳහා සකස් කරන ලද මෘදුකාංග සංවර්ධන පිරිවිතරයන් (Software Requirement Specification) බද්ද ක්‍රියාවලීන්ගේ පහසුව සඳහා විවිධ අවස්ථාවල වෙනස් කරන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් වීම, වලට භාජනය වීම, මෙතෙක් Manual කාර්යයන් සිදුකළ නිලධාරීන් මෙම මෘදුකාංගය තුලට ඇතුළත් කරගැනීමට සැලකිය යුතු කාලයක් ගතවීම මෙන්ම සජීවී මෙහෙයුම්කරණයේ (Live Operation) යෙදීමේදී පරිහරණය කරන්නන්ට වඩාත් පහසු (User Friendly) ආකාරයෙන් සිදුකිරීමට අවශ්‍ය පරිසරය ගොඩනඟා ගත යුතු වීම වැනි කාරණා නිසා මෙම ව්‍යාපෘතියට ඇස්තමේන්තු ගත කාලයට වඩා වැඩි කාලයක් ලබාගැනීමට සිදුවිය. දැනට මෙම මෘදුකාංගය සජීවී ක්‍රියාවලියේ (Live Operation) සිදුකරනු ලැබේ.

(ඇ) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන්වන වර්ෂයේ අනුමත සේවක සංඛ්‍යාව 219 ක් වේ. ඒ අනුව 2020 ජූලි මස වනවිට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 05 න් අධ්‍යක්ෂ (සැලසුම්) තනතුර සම්පූර්ණ කර ඇත.

ඉතිරි තනතුරු 04 ප්‍රවාහන ඉංජිනේරු තනතුරු වේ. ප්‍රවාහන ඉංජිනේරු තනතුරු 04 සඳහා කිහිපවිටක්ම අනුමත බඳවාගැනීම් හා උසස්වීම් පරිපාටිය අනුව පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත්

කැඳවා සම්මුඛ පරීක්ෂණ සිදුකරන ලදී. නමුත් එම තනතුර සඳහා තේරී පත් වූ අයදුම්කරුවන් ඉංජිනේරු දීමනාව නොලැබෙන බැවින් තනතුරු භාරගැනීම ප්‍රතික්ෂේප කරන ලදී.

වව්නියාව කාර්යලයේ තෘතීය මට්ටමේ තනතුරක් වූ කණිෂ්ඨ කළමණාකාර තනතුර සඳහා පැවති පුරප්පාඩුව මේ වනවිට සම්පූර්ණ කර ඇත. ද්විතීය මට්ටමේ තනතුරු සඳහා 2019.09.17 දින පළකරන ලද පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා ඇති අතර, පාර්ලිමේන්තු මැතිවරණය අවසන් වූ පසු, අදාල සම්මුඛ පරීක්ෂණ කටයුතු සිදු කිරීමට සැළසුම් කර ඇත.

ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහාද අයදුම්පත් කැඳවා ඇති අතර, පාර්ලිමේන්තු මැතිවරණය අවසන් වූ පසු, අදාල සම්මුඛ පරීක්ෂණ කටයුතු සිදු කිරීමට සැළසුම් කර ඇත.

(ඇ) රියදුරු/ කොන්දොස්තර මහතුන් සඳහා බෙදා දීමට කටයුතු කරන ලද නිලඇඳුම් ඔවුන් වෙත ලබාදුන්ලේඛන ලිපිගොනුවල පවතින අතර, අවශ්‍ය අවස්ථාවේදී ඉදිරිපත් කළ හැකිය.

එසේම මෙම නිලඇඳුම් 1801 ප්‍රමාණයක් ඉතිරි වී ඇත්තේ නිලඇඳුම් බෙදීමේදී ඒ සම්බන්ධව විරෝධයක් පාමින් උද්ඝෝෂණ සිදුකිරීම හා බස්රථ වර්ජනයකට යාමට කටයුතු කළ බැවින් වන අතර, ඉදිරියේදී මෙම නිල ඇඳුම් බෙදාදීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නව මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරන ලද ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබේ. ඒ අනුව සාමාන්‍ය මාර්ගයන්හි මගීසේවා අවසරපත්‍රනිකුත් කිරීම සඳහා 2005දී අනුමත කරන ලද අංක අමප/05/1461/031/036 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරවද, අධිවේගී මාර්ගයන්හි නව මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම 2017 වර්ෂයේඅමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරන ලද 17/0700/709/029 දරණ පත්‍රිකාවේ සඳහන් ක්‍රමවේදය මත සිදුකරනු ලබයි.

2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයට පෙර 2014 වර්ෂයේ අංක අමප / 14/1061/535/004- I දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන්ද අධිවේගී මාර්ගයේ මගීසේවා අවසරපත්‍ර නිකුත් කර ඇති අතර, 16/0065/709/003 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් හඳුන්වා දුන් ක්‍රමවේදය හරහාද මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීමසඳහා ටෙන්ඩර් කැඳවන ලද අතරඅධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් එම ටෙන්ඩර් අවලංගු කිරීමට සිදුවිය.

ඉහත සඳහන් සියළු අමාත්‍ය මණ්ඩල තීරණවල සඳහන් ක්‍රමවේදයන් අවලංගු කොට නව ක්‍රමවේදයක් සකස් කිරීමේ අරමුණින් මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීමේ නව ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා අමප/19/0409/123/17 දරණ අමාත්‍ය මණ්ඩල සන්දේශයන්ට අනුව කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටුව මඟින් ක්‍රමවේදයක් කෙටුම්පත් කර අමාත්‍යාංශ වෙත භාර දී ඇත. එමෙන්ම ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු යොදා

ඇති අතර, එම යෝජිත සංශෝධනයන් කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රවාහන සේවා කලමණාකරන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නව මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරන ලද ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබේ. ඒ අනුව සාමාන්‍ය මාර්ගයන්හි මගීසේවා අවසරපත්‍රනිකුත් කිරීම සඳහා 2005දී අනුමත කරන ලද අංක අමප/05/1461/031/036 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරවද, අධිවේගී මාර්ගයන්හි නව මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම 2017 වර්ෂයේඅමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරන ලද 17/0700/709/029 දරණ පත්‍රිකාවේ සඳහන් ක්‍රමවේදය මත සිදුකරනු ලබයි.

2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයට පෙර 2014 වර්ෂයේ අංක අමප / 14/1061/535/004- I දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන්ද අධිවේගී මාර්ගයේ මගීසේවා අවසරපත්‍ර නිකුත් කර ඇති අතර, 16/0065/709/003 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් හඳුන්වා දුන් ක්‍රමවේදය හරහාද මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීමසඳහා ටෙන්ඩර් කැඳවන ලද අතරඅධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් එම ටෙන්ඩර් අවලංගු කිරීමට සිදුවිය.
ඉහත සඳහන් සියළු අමාත්‍ය මණ්ඩල තීරණවල සඳහන් ක්‍රමවේදයන් අවලංගු කොට නව ක්‍රමවේදයක් සකස් කිරීමේ අරමුණින් මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීමේ නව ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා අමප/19/0409/123/17 දරණ අමාත්‍ය මණ්ඩල සන්දේශයන්ට අනුව කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටුව මඟින් ක්‍රමවේදයක් කෙටුම්පත් කර අමාත්‍යාංශ වෙත භාර දී ඇත. එමෙන්ම ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇති අතර, එම යෝජිත සංශෝධනයන් කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රවාහන සේවා කලමණාකරන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. තවදපනත සංශෝධනය කිරීමට අවස්ථා කිහිපයකදිඋත්සාහ දරා ඇතත් එය ඉටුවී නොමැත.

(ඊ) 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 24 වැනි වගන්තිය අනුව මගී අවසරපත්‍ර නිකුත් කිරීමට කොමිෂම වෙත ප්‍රතිපාදන පැවතියත් මගීසේවා අවසරපත්‍ර විවෘත හා විනිවිද භාවයකින් නිකුත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳව පනතේ සඳහන් නොවේ. ජාතික ගමනාගමන කොමිෂන් සභාව ස්ථාපිත කල අවධියේ සිට 2008 වර්ෂය දක්වා මගීසේවා අවසරපත්‍ර නිකුත් කර ඇත්තේ එක් එක් පුද්ගලයන් විසින් කරනු ලබන ඉල්ලීම් පදනම් කරගෙනය. එහිදි විවෘත හා විනිවිදභාවයක් නොවීය. එම මගීසේවා අවසරපත්‍රවල ආයු කාලය පිළිබඳ කිසිදු සඳහනක් නොවූ අතර රු. 3000/= ක මුදලක් අයකර වාර්ෂිකව යාවත්කාලීන කර ඇත.

2005 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අංක අමප/05/1461/031/036 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නිත්‍ය මගීසේවා අවසරත්‍ර නිකුත් කිරීමේදී ටෙන්ඩර් ක්‍රමවේදය අනුගමනය කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර, මෙම ක්‍රමවේදය මඟින් මුල්වරට ටෙන්ඩර් කැඳවා ඇත්තේ 2008 වර්ෂයේදීය.

ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව ස්ථාපිත කල අවධියේ සිට 2008 වර්ෂය දක්වා එනම් අවුරුදු 15කට ආසන්න කාලයක් ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම මත සභාපතිතුමාගේ අභිමතය පරිදි මගීසේවා අවසරපත්‍ර නිකුත් කර ඇත.

2019.12.31 දිනට ලබා දුන් දත්තවලට අනුව වලංගු මගීසේවා අවසරපත්‍ර 3103න් ටෙන්ඩර් ක්‍රමවේදයට නිකුත් කර වලංගුව පවතින මගීසේවා අවසරපත්‍ර ප්‍රමාණය 223ක්වේ. ඒ අනුව වලංගුව පවතින ඉතිරි මගීසේවා අවසරපත්‍ර 2880ම ටෙන්ඩර් ක්‍රමවේදය ක්‍රියාමත්මක කිරීමට පෙර නිකුත් කල මගීසේවා අවසරපත්‍ර වේ. ජාතික ගමනාගමන කොමිෂන් සභාව පනතේ 24 හා 30 වගන්තිවලට අනුව මගීසේවා අවසරපත්‍රයක කාලය පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති තීරණයට අනුව අවසරපත්‍ර කාලය පිළිබඳ සීමාවක් දක්වා නොමැත.

දැනට පවතින මගීසේවා අවසරපත්‍රයක් යම් සංශෝධනයකට ලක්වන අවස්ථාවකදී (මාර්ග සංශෝධනය හා ඥාතීත්වයමත අයිතිය සංශෝධනය) එම මගීසේවා අවසරපත්‍රවල වාර්ෂික යාවත්කාලීන කිරීමේ ගාස්තුව රු. 3000/= සිට රු 15000/= ක් දක්වා වැඩි කරනු ලැබේ.

ඒ අනුව දැනට වලංගුව පවතින මගීසේවා අවසරපත්‍ර 223 ක් ටෙන්ඩර් ගාස්තුව හා රු. 3000/=ක් අයකිරීමෙන්ද, බලපත්‍ර 922ක් රු. 15000/=ක් අයකිරීමෙන්ද වාර්ෂිකව යාවත්කාලීන කරනු ලබයි. ඉතිරි මගීසේවා අවසරපත්‍ර සඳහා අයකරනු ලබන්නේ රු. 3000/=ක මුදලක් වන අතර එම මුදල වැඩි කිරීම පිළිබඳව අවධානය යොමු කර ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් අධිවේගී මාර්ගයේ තාවකාලික අවසරපත්‍ර මත ධාවනය වන බස්රථ සේවා සඳහා නිත්‍ය මගීසේවා අවසරපත්‍ර 48ක් නිකුත් කිරීම සඳහා අංක 26 ටෙන්ඩරය 2018 වර්ෂයේ කැඳවන ලද නමුත් එය විවෘත කර බලපත්‍ර ප්‍රදානය කිරීමට විරුද්ධව බස්රථ හිමියන් විසින් නඩු පවරන ලදි. ඒ අනුව ටෙන්ඩරය සඳහා ඇති තහනම් නියෝගය නිසා එය විවෘත කිරීමට නොහැකිව පවතින අතර එම හේතුවෙන් තාවකාලික අවසරපත්‍ර මත ධාවනය වන බස්රථ සඳහා නිත්‍ය මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීමට හැකියාව නොලැබී ඇත. මගී අවශ්‍යතාවය සපුරාලීම සඳහා තවදුරටත් තාවකාලික අවසරපත්‍ර නිකුත් කිරීමේ අවශ්‍යව ඇත.

(උ) දැනට ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් නව බලපත්‍ර නිකුත් කිරීමට ක්‍රියාත්මක කරන ක්‍රමවේදය වන විවෘත ටෙන්ඩර් කැඳවීමේදී ටෙන්ඩර්කරුවන් විසින් සිය සේවාව මඟින් ඉපැයිය හැකි ඉපැයීමට වඩා විශාල ටෙන්ඩර් මුදලක් මත ටෙන්ඩර් ඉල්ලුම් කිරීමේ ප්‍රවනතාවයක් ඇත. ඒ හේතුවෙන් ටෙන්ඩර්කරුවන් හට බලපත්‍ර නිකුත් කලද එම සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන නොයන අතර, කාලයක් ගොස් අදාල ටෙන්ඩර් කරන ලද බස් සේවාවෙන් ඉවත් වේ. ඒ අනුව දැනට නව ක්‍රමවේදයක් සකස් කරමින් පවතින බැවින් එම ක්‍රමවේදය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමත වීමෙන් පසුව නව මාර්ග සඳහා ටෙන්ඩර් කැඳවීමට සිදුකිරීමේ හැකියාව ඇත.

තවද, විශාල මගී ඉල්ලුමක් පවතින අවස්ථාවන්හිදී හා නිත්‍ය සේවා බස්රථ ධාවනයට නොපැමිණෙන අවස්ථාවන්හිදී රු. 200/=, රු. 1000/= හා රු. 1500/= ලෙස දෛනිකව ගාස්තු අය කිරීම මත තාවකාලික අවසරපත්‍ර නිකුත් කිරීම කලද එම මගී ඉල්ලුම අඛණ්ඩව නොපවති. එමෙන්ම මගී අවශ්‍යතාවය මත නිත්‍ය මගීසේවා අවසරපත්‍ර හිමි බස්රථ ඉහත පරිදි ගාස්තු අයකර වෙනත් මාර්ගවලට තාවකාලිකව යොමු කරනු ලබයි. ඒ අනුව සති අන්තයේ මෙන්ම දීර්ඝ සති අන්තයක් පවතින අවස්ථාවන්හිදිපමණක් වැඩි මගී ඉල්ලුමක් පවතින බැවින්, එම සති අන්ත කාලයට පමණක් වලංගු වන ලෙස නිත්‍ය මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම ඵලදායී නොවනු ඇත.

(ඌ) ඉදිරියේදී වත්කම් ලේඛණයේ වත්කම් ඉවත් කිරීම සටහන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගන්නා ලදී. එසේම මිලදී ගන්නා ලද එම වත්කම් සියල්ල වත්කම් ලේඛණයේ සටහන් කර ගෙන යාවත්කාලීන කිරීමට හා වත්කම් ලේඛණයේ අඩුපාඩුකම් සම්පූර්ණකරගැනීමට පියවර ගන්නා ලදී.

සෑම වර්ෂයක් සඳහාම මිලදී ගන්නා ලද පුස්තකාල පොත් අදාල වර්ෂය සඳහා වෙන වෙනම ලේඛණ ගත කර ඇත.

(එ) බැස්ටියන් මාවත පොලිස් මුරපොළ අසල පිහිටි වැසිකිලි පද්ධතියේ පොදු පහසුකම් සපයාදීම සඳහා නඩත්තු කර මගී පරිහරණය සඳහා පවත්වාගෙන යෑමට පෞද්ගලික ආයතනයක් වන මේධා එන්ටර්ප්‍රයිසස් ආයතනය සමඟ 2010.09.18 දින සිට 2020.09.17 දින දක්වා වසර 10 ක කාලයක් සඳහා ගිවිසුම්ගත වී ඇත.

මෙම වැසිකිලි පද්ධතියේ අළුත්වැඩියාවන් සඳහා රුපියල් ලක්ෂ 58ක් වියදමක් මේධා එන්ටර්ප්‍රයිසස් ආයතනය විසින් දරා ඇත. ගිවිසුම් ප්‍රකාරව දෙපාර්ශවයේ එකඟතාව මත ආරම්භයේ රුපියල් 525,000.00 ක මාසික කුලි පදනම මත,එහි පරිපාලනය එම ආයතනයට ලබා

දී ඇත. සෑම වර්ෂයකම මෙම මාසික කුලිය 10% කින් වැඩිවේ. ඒ අනුව 2020 වර්ෂය වන විට මාසික කුලිය රු.768,652.50 ක් වේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත කරනු ලබන මාසික ගෙවීම ඇතුළු කොන්දේසි කිහිපයක් පැහැර හැරීම හේතුවෙන් එම ආයතනයේ කළමනාකරු, ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ගෙන්වා අවස්ථා කිහිපයකදීම සාකච්ඡා පවත්වා පහත සඳහන් එකගතාවයන් වලට එලඹෙන ලදී.

- 2019 දෙසැම්බර් මස 31 දිනට ප්‍රථම හිඟව ඇති මාසික කුලී වාරික වලින් මාස 03ක මුදල් හැර ඉතිරි සියළුම හිඟ වාරික ගෙවීම.
- වැසිකිලි පද්ධතිය නඩත්තු කිරීමේදී පැන නගින සියළුම ගැටළු ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පාලන අංශය වෙත යොමු කරන ලෙසත් ඒ අනුව අදාල විසඳුම් ලබා ගන්නා ලෙස.
- වැසිකිලි පද්ධතිය පරිහරණය කරන්නන්ගෙන් රු.10 ක මුදලක් පමණක් අය කරගන්නා ලෙසත් එම අයකිරීම අදාල ස්ථානයේ ප්‍රදර්ශනය කරන ලෙස.

බැස්ටියන් මාවත බස් පර්යන්තයට අදාල පරිශ්‍රයේ බහුවිධ ප්‍රවාහනමධ්‍යස්ථාන ව්‍යාපෘතිය 2020 වර්ෂයේ අවසාන භාගයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට යෝජිත බව නාගරික සංවර්ධන අධිකාරිය මඟින් දන්වා තිබූ බැවින් බැසිටියන් මාවත බස් පර්යන්තයේ ආබාධිත අය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට වෙන් කරන ලද මුදල් , බස් සේවක කණ්ඩායම් සඳහා පහසුකම් ලබා දීමට යෝජිත කන්වටෙනර් ලබා ගැනීම සඳහා යොදවා ගැනීමට 2019-10-18 දින පැවැති කොමිෂන් සභා රැස්වීමේදී අනුමැතිය ලැබී ඇත.

(ඒ) 2019 ක්‍රියාකාරී සැලැස්මට අනුව පෙරගෙවුම් කාඩ්පත් ව්‍යාපෘතිය හඳුන්වා දී තිබුණද මෙම ව්‍යාපෘතිය ජාතික ගමනාගමන කොමිෂන් සභාවට පමණක් තනිව ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘතියක් නොවීය. ප්‍රවාහන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව, අනෙකුත් වාණිජ බැංකු, ශ්‍රී ලංගම, බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හා ජාතික ගමනාගමන කොමිෂන් සභාව වැනි ආයතන කිහිපයක එකතුවකින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුව තිබුණි.

ඒ අනුව 2019 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය සිදුකරන ආකාරය සම්බන්ධව සියළු පාර්ශවකාර ආයතන අතර සාකච්ඡා 12 ක් පවත්වා ඇති අතර මේ වන විට මෙම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඔ) ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිසි සැරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමඟ පමණක් වේ. ඒ අනුව 2018/2019 වර්ෂ සඳහා ශ්‍රීලංගමය

විසින් නිසිසැරිය සේවා 128ක් නිර්දේශ කර මෙම ව්‍යාපෘතියට ඇතුලත් කරගැනීම සඳහා 2017 වර්ෂයේදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත යොමු කර තිබුණි. එසේ යොමු කරන ලද සේවා 128 සත්‍ය වශයෙන්ම ධාවනය වනවාද යන්න පරීක්ෂාකර බලා ගිවිසුම්ගත වීමට 2017/09/03 දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී අනුමැතිය ලබාගන්නා ලදී. ඒ අනුව මෙම සේවා 128 න් 42ක් 2018 වර්ෂයේ පරීක්ෂා කර ධාවනය වන බවට තහවුරු කර ගැනීමෙන් පසුව නිසි සැරිය ව්‍යාපෘතියට ඇතුලත් කර ගන්නා ලදී.

එමෙන්ම ශ්‍රීලංගම විසින් නිර්දේශ කළ ඉහත සේවා 128න් සේවා 50ක් ආරම්භ කිරීමට 2019 වර්ෂයේ සැලසුම්කර තිබුණි. ඒ අනුව සේවා 31ක් 2019 වර්ෂය තුලදී ජංගම පරීක්ෂණ අංශය විසින් පරීක්ෂා කර ඇති අතර ඉන් ධාවනය වන බවට තහවුරු වූයේ සේවා 06ක් පමණි. සේවා 25ක් ධාවනය නොවන බව තහවුරු විය. එබැවින් එම සේවා 06ට පමණක් ගිවිසුම් අත්සන් කරන ලදී.

මෙම වර්ෂයේදී ඉතිරි සේවා පරීක්ෂා කිරීම සඳහා ජංගම පරීක්ෂණ අංශය වෙත යොමු කර ඇත.